තාක්ෂණික ආයතනය

මොරටුව විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

වාර්ෂික වාර්තාව

හා

වාර්ෂික ගිණුම්

2018

(2019-03-21 දින පැවති 217 වෙනි කළමනාකරණ මණ්ඩල රැස්වීමේදී අනුමත කරන ලදී.)

!

දැක්ම

තාක්ෂණික අධ්‍යාපනය පිළිබඳ විශිෂ්ඨ මධ්‍යස්ථානයක් බවට පත්කිරීම.

මෙහෙවර ප්‍රකාශය

කලාපයේ ක්‍රියාශීලී තාක්ෂණික ආයතනයක් බවට පත්කිරීම මෙන්ම ශ්‍රී ලාංකීය ප්‍රජාවගේ අධ්‍යාපනය, ආර්ථික සහ සමාජීය දියුණුව සඳහා සක්‍රිය දායකත්වයක් ලබාදීම.

- *සමාජයේ සහ කර්මාන්තකරණයේ අවශ්‍යතා සපුරාලීම සඳහා ලඟා විය හැකි, නම්‍යතාවයෙන් යුතු කාර්යක්ෂම තාක්ෂණික අධ්‍යාපනයක් සහ පුහුණුව ලබාදීම.*
- *නව්‍යකරණ සහ නිර්මාණශීලී පරිසරයක් ගොඩනැගීම.*
- *වෘත්තීය අවශ්‍යතා සඳහා කර්මාන්ත ක්ෂේත්‍රය සහ ව්‍යාපාරික ප්‍රජාව සමඟ ක්‍රියාශිලි සංවාදයක් ඇතිකිරීම.*
- *තරුණයින්හට සමාජයීය ආර්ථික මාර්ගයන් සඳහා විවෘත වන අවස්ථාවන් පුළුල් කිරීම.*

පටුන

		පිටු අංකය
	දැක්ම	i
	මෙහෙවර	i
01.	අධ්‍යක්ෂතුමියගේ සමාලෝචනය	**1**
02.	තාක්ෂණික ආයතනයේ අරමුණු	**9**
03.	ජාතික තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාවේ කෙටි ඉතිහාසය සහ මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනය ස්ථාපිත කිරීම	**10**
04.	ආයතනයේ කළමණාකරන මණ්ඩලය	**14**
05.	ආයතනයේ නිළධාරීන්	**15**
	5.1 සංවිධාන සැලැස්ම - **2018**	**16**
06.	තොරතුරු ලබා ගැනීමේ පහසුකම්	**17**
07.	කාර්යය මණ්ඩලය සහ සිසුන් පිළිබඳ විස්තර	**18**
	7.1 දේශීය සිසුන් පිළිබඳ විස්තර	**19**
	7.2 අධ්‍යයන සහ අනධ්‍යයන කාර්යය මණ්ඩල පිළිබඳ විස්තර	**20**
08.	පර්යේෂණ, නව නිමැවුම් සහ ප්‍රකාශන පිළිබඳ විස්තර	**21**
09.	වැඩ සටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර	**25**
10.	ආයතනයේ ක්‍රියාකාරකම්	**28**
11.	ලැබූ ප්‍රදානයන් පිළිබඳ විස්තර	**31**
12.	පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර	**32**
13.	මූලධන වියදම් පිළිබඳ විස්තර	**32**
14.	ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර (දේශීය/විදේශීය අරමුදලින්)	**32**
15.	මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තරය (වැය)	**33**
16.	මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තරය (උපයන ලද ආදායම)	**33**
17.	මූල්‍ය ක්‍රියාකාරීත්වය සමාලෝචනය - **2018**	**33**
18.	තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම	**34**
19.	විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන	**36**
20.	විගණන කමිටු වාර්තාව	**40**
21.	විගණකාධිපතිවරයාගේ වාර්තාව	**41**
22.	විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු	**52**

01. හැඳින්වීම

<u>අධ්‍යක්ෂතුමියගේ සමාලෝචනය</u>

මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනය (ITUM) යනු ජාතික හා ජාත්‍යන්තරව පිළිගත් ජාතික තාක්ෂණ ඩිප්ලෝමා (NDT) අධ්‍යයන වැඩසටහන පැවැත්වීම සඳහා මූලික වශයෙන් වගකිව යුතු උසස් අධ්‍යාපන ආයතනයකි.

රසායනික, සිවිල්, විදුලි, ඉලෙක්ට්‍රොනික, යාන්ත්‍රික, නාවික, නාවුක, පොලිමර් සහ රෙදිපිළි යන අංශ 09 කින් පෙබරවාරි 8 වන දින සිසුන් 830 දෙනෙකු සමඟ ආයතනය 2018 වර්ෂය සඳහා අධ්‍යයන කටයුතු ආරම්භ කරන ලදී.

2018 වර්ෂය සඳහා මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණ ආයතනයේ වැඩකටයුතු ආරම්භ කළේ ආයතනයේ කාර්ය මණ්ඩලය සහ සිසුන්ගේ සහභාගීත්වයෙන් සිදු කළ සර්ව ආගමික උත්සවයක් සමඟිනි. පෙර වර්ෂාවසානයේ ආරම්භ කළ විභාග කටයුතු ජනවාරි මාසයේ දී අවසන් විය. විභාග කටයුතු අවසාන වීමෙන් පසුව නව කණ්ඩායමේ සිසුන් 500 දෙනා සඳහා ඉංග්‍රීසි අධ්‍යයන වැඩසටහන ආරම්භ වූයේ ඒකාබද්ධ දිශානති වැඩසටහනක් සමඟිනි.

ආයතනයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලය සහ සිසුන් අතර ඇති වූ ගැටුම්කාරී තත්වයක් හේතුවෙන් විභාග පැවැත්වීම බාධා ඇති වූ නමුත් පරිපාලනය විසින් අදාල තත්වය පාලනය කරන ලදි. නැවතත් මසකට පමණ පසු අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෙකු සහ කුඩා සිසුන් කණ්ඩායමක් අතර නැවතත් ගැටුම්කාරී තත්වයක් ඇති විය. මෙම සිද්ධියේ ප්‍රතිඵලය ලෙස එම ශිෂ්‍ය කණ්ඩායම ආයතන පරිශ්‍රයෙන් ඉවත් කොට පරීක්ෂණයක් පවත්වා වැරදිකරුවන් වූ සිසුන්ට දඬුවම් නියම කරනු ලැබීය.

සිසුන් 350 දෙනෙකුගෙන් යුත් තෙවන වසරේ කණ්ඩායම ඔවුන්ගේ පළමු මාස හයේ කාර්මික පුහුණුව පෙබරවාරි මස අවසානයේදී ආරම්භ කරන ලදී. සුපුරුදු පුහුණු සම්මන්ත්‍රණය නොපැවැත්වූයේ අදාළ ශිෂ්‍ය කණ්ඩායම ආයතන පරිශ්‍රයෙන් ඉවත් කර තිබූ බැවිනි. දෙවන වසරේ සිසුන් 350 දෙනා සහ නව පළමු වසර සිසුන් 500 දෙනා සඳහා අධ්‍යයන කටයුතු ද පෙබරවාරි මාසයේ දී ආරම්භ විය. පළමු වසරේ සිසුන් සංශෝධිත ජාතික තාක්ෂණ ඩිප්ලෝමා විෂය මාලාව සෙමෙස්තර ක්‍රමය අනුව සිදු කළ අතර දෙවන වසරේ සිසුන් වාර්ෂික ක්‍රමය තුළ දිගටම ඉගෙන ගත්හ.

පෙබරවාරි මස අග ආරම්භ වී අප්‍රේල් මස මැද දක්වා පැවති විශ්වවිද්‍යාල පද්ධතියේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ මාස දෙකක දීර්ඝ වෘත්තීය සමිති ක්‍රියාමාර්ගය හේතුවෙන් ආයතනයේ අධ්‍යයන හා අනෙකුත් සියලු කටයුතු අඩාල විය.

පළමු වසරට අදාල යන්ත්‍රාගාර පුහුණු කටයුතු නියමිතව තිබූ කාලය තුළ සිදු කිරීම අපහසු වූයේ සියලුම සිසුන් සඳහා යන්ත්‍රාගාර පුහුණුව සිදු කිරීමට අවශ්‍ය පහසුකම් සපයා ගැනීමේ ගැටළුකාරී තත්වයක් ඇති වූ බැවිනි. වෘත්තීය සමිති ක්‍රියාමාර්ගය අවසන් වීමෙන් පසු මඟ හැරුණු විභාගය මැයි මාසයේදී පවත්වන ලද අතර අදාල සියලුම වැඩමුළු, ප්‍රායෝගික පන්ති ආදිය අධ්‍යයන හා අධ්‍යයන නොවන කාර්ය මණ්ඩලයේ සහාය ඇතිව නැවත පවත්වන ලදී.

යන්ත්‍රාගාර උපකරණ නියමිත පරිදි ස්ථාපනය කිරීමෙන් පසුව අදාල සංවර්ධන ව්‍යාපෘතිය මඟින් තාක්ෂණික ආයතනයට ලබා දී ඇති වටිනා අධ්‍යයන සම්පත් අනෙකුත් විශ්ව විද්‍යාලවල අධ්‍යයන කටයුතු සඳහා ද ලබා දීමේ හැකියාව ලැබුණි.

අධ්‍යයන කටයුතු මැයි මාසයේ දී නැවත ආරම්භ කරන ලද අතර එතැන් පටන් එය අඛණ්ඩව සිදු විය. සියලුම සිසුන්ට අගෝස්තු මස මුලදී සති 02 ක අධ්‍යයන විවේකයක් ලබා දෙන ලදී. සති 15 ක අධ්‍යයන කටයුතු නිම කිරීමෙන් පසු එම මාසයේම පළමු වාරයේ පළමු විභාගය සාර්ථකව පවත්වන ලදී.

සංශෝධිත කාලසටහනට අනුව වර්ෂය සඳහා වූ අධ්‍යයන කටයුතු අවසන් විය. සිවිල් ඉංජිනේරු සිසුන් සඳහා පවත්වන සති 02 ක වාර්ෂික නේවාසික සමීක්ෂණ කඳවුර දෙසැම්බර් මාසයේදී සාර්ථකව පවත්වන ලදී.

පැවරුම් පදනම මත වැඩ කළ වැඩබලන සහකාර පුස්තකාලයාධිපතිගේ සහ පුස්තකාල කමිටුවේ උපදෙස් පරිදි අධ්‍යයන කටයුතු සඳහා තාක්ෂණික ආයතනයේ පුස්තකාලයේ සහාය ලැබුණි. ආපනශාලා පහසුකම් සහ වෛද්‍ය මධ්‍යස්ථාන පහසුකම් නිසා නේවාසිකාගාරවල රැඳී සිටින ශිෂ්‍යයන් හට පහසුකම් රැසක් හිමි වී තිබේ.

සියලු ම අධ්‍යයන හා පරිපාලන කාර්යය මණ්ඩලයේ සහභාගීත්වයෙන් මෙවර ද මොරටුව විශ්වවිද්‍යාලතාක්‍ෂණ ආයතනයේ වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණය අඛණ්ඩව පස්වන වරටත් අගෝස්තු මාසයේ දී පවත්වන ලදී.

ශිෂ්‍ය ක්‍රියාකාරකම්

නාවුක ඉංජිනේරු අංශයේ සිසුන් විසින් වාර්ෂිකව පවත්වන ලේ දන් දීමේ කඳවුර 2018 වර්ෂයේ දී ද සාර්ථකව සංවිධානය කරන ලදී. සංස්කෘතිකාංග ඇතුලත් කරමින් වාර්ෂිකව පවත්වනු ලබන "අසනි" වැඩසටහන සෞන්දර්යය විෂයයන් භාර ආචාර්යයවරුන්ගේ මහ පෙන්වීම යටතේ දින හතරක් පුරාවට පවත්වන ලදි. වසර තුල මෙවැනි විශේෂාංග රැසක් සිදු කල අතර මෙම වසරේ අවසාන ශිෂ්‍ය ක්‍රියාකාරකම ලෙස පිරිත් පිංකමක් සංවිධානය කරන ලද අතර මෙම සියලු අවස්ථා සඳහා ජාතික තාක්ෂණික ඩිප්ලෝමා ශිෂ්‍ය සංගමයේ දායකත්වය ලබා දී ඇත.

ශිෂ්‍ය බඳවා ගැනීම 2019

2019 වර්ෂය සඳහා සිසුන්ගේ සංඛ්‍යාව 800 දක්වා වැඩි කිරීමට තීරණය කළ අතර ගැසට් පත්‍රයේ පල කිරීම සහ වෙබ් අඩවි දැන්වීම් මගින් අයදුම්පත් කැඳවන ලදී. තෝරාගත් අයදුම්කරුවන් සඳහා මහනුවර, මාතර, වව්නියා සහ දියගම යන මධ්‍යස්ථානවල යෝග්‍යතා පරීක්ෂණය පැවැත්වීමෙන් අනතුරුව ලියාපදිංචි කිරීම ඔක්තෝබර් සහ නොවැම්බර් මාසවලදී සිදු කරන ලදී. නවක සිසුන් 800 දෙනා සඳහා සමාරම්භක උත්සවය දෙසැම්බර් මාසයේදී පවත්වන ලද අතර තාක්ෂණික ආයතනයේ පළමු පුවත්පත් සඟරාව උපකුලපතිවරයාට සහ කළමණාකරණ මණ්ඩලයේ සාමාජිකයින්ට පිළිගැන්වීම මෙහි දී සිදු කරනු ලැබීය

විෂයමාලා සංශෝධනය

සංශෝධිත ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පළමු වසරේ විෂය මාලාව අධ්‍යයන වාර දෙකකින් ක්‍රියාත්මක කරන ලද අතර එම සංශෝධිත විෂය මාලාවට කලා විෂයයන් ලෙස ක්‍රීඩා අධ්‍යයනය හා සෞන්දර්යාත්මක විෂයයන් ලෙස මොඩියුල දෙකක් ඇතුළත් විය. එමෙන් ම එතෙක් ඒකාබද්ධ විෂයයන් ලෙස උගන්වනු ලැබූ Strength of Materials හා Engineering Mechanics විෂය සහ Fluid Mechanics හා Applied Thermodynamic යන විෂයයන් ස්වාධීන මොඩියුල ලෙස ඉදිරිපත් කරන ලදී.

ජාතික තාක්ෂණික ඩිප්ලෝමාවේ දෙවන වසරේ විෂය මාලාව සංශෝධනය කිරීමට අදාළ කටයුතු අදාල අංශවල කාර්ය මණ්ඩලය විසින් සිදු කරන ලදී. දෙවන වසර අධ්‍යයන වාරය අධ්‍යයන වාර දෙකකට පරිවර්තනය කිරීමට තීරණය විය. සියළුම අධ්‍යයන අංශවල නව විෂය මාලාවන් කර්මාන්ත ක්ෂේත්‍රයන් හා අධ්‍යයන ක්ෂේත්‍රයන් වලින් සමන්විත මණ්ඩල සඳහා ඉදිරිපත් කරන ලද අතර එහිදී ඉදිරිපත් වූ අදහස් සැලකිල්ලට ගනිමින් තුන් වන සෙමෙස්තරයේ විෂයය මාලාවන් සම්පූර්ණ කරන ලදි.

ජාතික තාක්ෂණික ඩිප්ලෝමාවේ නවතම වැඩසටහන ලෙස තොරතුරු තාක්‍ෂණ විෂය ඇතුළත් කිරීමට තීරණය කර ඇති අතර ඒ සඳහා ක්ෂේත්‍රයේ ප්‍රවීණ උපදේශකවරුන් සේවයේ යොදවා ඇත. එමඟින් ජාතික තාක්ෂණික ඩිප්ලෝමාවේ අද්විතීය වැඩසටහනක් බවට තොරතුරු තාක්ෂණය පත් කර ඇත. සිසුන් සිය දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් සඳහා තොරතුරු තාක්‍ෂණ විෂය මාලාවේ සංවර්ධිත අධ්‍යයන වාරය 2019 දී ක්‍රියාත්මක කරන ලදී.

I සහ II අධ්‍යයන වාරය සඳහා මොඩියුල ලබා දීම, සම්මාන ගණන, ඇගයීම් නිර්ණායක සහ ශ්‍රේණිගත කිරීම අධ්‍යයන මණ්ඩලය විසින් නිර්දේශ කරන ලද අතර කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

විභාග පැවැත්වීම

දෙවන වසර, පළමු වසර (දෙවන වර පෙනී සිටීම) සහ දෙවන වාරයේ අවසාන විභාගය ආදී විභාගයන් දෙසැම්බර් මාසයේ ආරම්භ වී 2019 ජනවාරි වලින් අවසන් විය.

තාක්ෂණික ආයතනයේ ප්‍රතිස්ථාපන හා සංවර්ධන ව්‍යාපෘතිය

ප්‍රතිස්ථාපන හා සංවර්ධන ව්‍යාපෘතිය වසරක වගකීම් කාලයක් සමඟ 2017.11.30 දින ආරම්භ විය. රුපියල් මිලියන 100 ක් වටිනා අපේක්ෂිත උපකරණ ඔවුන් විසින් සපයන ලද අතර ආයතනය තුල වාර්තා වූ අඩුපාඩු නියමිත පරිදි යථා තත්වයට පත් කරන ලදී.

පරිපාලනය සහ මූල්‍ය

අභ්‍යන්තර මාරුවීම්, උසස්වීම් සහ බාහිර අයදුම්පත් කැඳවීම මගින් 2017 දී අනුමත කරන ලද සේවක තනතුරු පිරවීමට ආයතනය සමත් විය. යාන්ත්‍රික වැඩමුළු 04 සඳහා බඳවා ගත් පුහුණු ශ්‍රම බලකාය මෙයට ඇතුළත් ය. සෑම අංශයක්ම පාහේ ආවරණය වන පරිදි නව අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 12 දෙනෙකු ස්ථිර සේවක මණ්ඩලයට බඳවා ගැනීමට ද තාක්ෂණික ආයතනය සමත් විය. පරිපාලන හා මූල්‍ය අංශවල පුරප්පාඩු 05 පුරවා ඇත්තේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නව බඳවා ගැනීම් සහ අභ්‍යන්තර මාරුවීම් මගිනි.

කළමණාකරණ මණ්ඩලයේ 200 වන රැස්වීම තාක්ෂණික ආයතනයේ හිටපු අධ්‍යක්ෂවරුන් තුන්දෙනෙකුගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.

ආයතනය මාසිකව පවත්වනු ලබන අධ්‍යයන මණ්ඩල රැස්වීම් සහ කළමණාකරණ මණ්ඩල රැස්වීම්වල වාර්තා විද්‍යුත් ක්‍රමවේදය මගින් බෙදා හැරීම ආරම්භ විය.

නාවුක අධ්‍යයන අංශය සඳහා වාර්ෂික විගණනය අවස්ථා දෙකක දී සාර්ථකව පවත්වනු ලැබීය.

කාගිල්ස් ෆුඩ් සිටි සහ ලංකා බැංකුව ඔවුන්ගේ දියගම ශාඛාවන් තාක්ෂණික ආයතනයට අයත් සාප්පු සංකීර්ණයේ විවෘත කළහ.

වටිනාකම් ක්ෂය වූ අබලි භාණ්ඩ බැහැර කිරීම සඳහා වසර අවසානයේ වෙන්දේසියක් පවත්වන ලදී.

තාක්ෂණික ආයතනයෙහි ආරක්ෂාව, පිරිසිදු කිරීම, පරිශ්‍ර අලංකරණය සහ පද්ධති නඩත්තු කටයුතු සඳහා දෙවන වසර සඳහාත් බාහිර සේවා සපයන්නන්ගේ සේවාව ලබා ගන්නා ලදී.

වසර 17 ක දීර්ඝ කාල සීමාවකින් පසුව 2017 වර්ෂයේ දී තාක්ෂණික ආයතනය නව ගොඩනැගිලි සංකීර්ණයකට ගෙන යන ලදී. බොහෝ දුරට අපේක්ෂා කරන ලද මෙම පියවර ආරම්භයේදීම ඉතා රළු සංක්‍රාන්තියක් ඇති කළ අතර එහි ප්‍රතිඵලයක් ලෙස සිසුන් සහ අධ්‍යයන නොවන කාර්ය මණ්ඩලය අතර ආවේගශීලී ගැටීම් මතු විය. තීරක පාර්ශවයන් ද තාක්ෂණික ආයතනය සිය නව පරිශ්‍රයට ගෙනයාම වාසිදායක ලෙස භාර ගැනීමට මැලි වීමෙන් එම තත්වය වඩාත් නරක අතට හැරුණි. එබැවින් ආයතනය සතු සීමිත මූල්‍ය තත්වය හා අවම සේවක සංඛ්‍යාවක් යටතේ බඳවා ගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව ඉහළ නැංවීමට සිදු වීමෙන් ආයතනය මහත් අපහසුතාවයට ලක් වීමක් සිදු විය.

බොහෝ අඩුපාඩු මගහරවා ගනිමින් තාක්ෂණික ආයතනය ලබා ඇති ජයග්‍රහණ අධ්‍යක්ෂතුමිය විසින් 2019 වර්ෂය ආරම්භයේදී කළමණාකරණ මණ්ඩලය වෙත වාර්තා කරන ලදී.

(ආ) ලැබූ ජයග්‍රහණ

<u>මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනය නැවත ගොඩනැගීමෙන් පසු ලද ප්‍රගතිය.</u>

මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනය, හෝමාගම දියගම නව ස්ථානයේ 2017 මැයි මස ස්ථාපිත කරන ලදි. එම ව්‍යාපෘතියේ මුළු වැය රුපියල් බිලියන දහයයි දශම දෙකකි (10.2). ආයතනය විසින් කරන ලද සංවර්ධන කටයුතු 2019 ජනවාරි මස අවසානය දක්වා වූ කාලයට අදාල සංවර්ධන කටයුතු පහත විස්තර කර ඇත.

01. <u>සිසුන් ඇතුලත් කරවා ගැනීම</u>.

2000 වසර ආරම්භයේ සිට වසර 17 ක් තුල ඇතුලත් කර ගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව එලෙස ම පැවතුණි. එනම් ඇතුලත් කර ගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව ආරම්භයේ සිටම වසර 17 ක් දක්වා 350 ක් විය. එසේ ස්ථාවර මට්ටමක පැවති ශිෂ්‍ය සංඛ්‍යාව 2018 සහ 2019 වර්ෂ වලදී 100% වර්ධනයක් පෙන්වා දෙමින් සිසුන් 800 කට වැඩි ප්‍රමාණයක් ලියාපදිංචි කරවීමට හැකි වී තිබේ.

විෂයය ධාරාව	2017	2018	2019
රසායනික	25	31	50
සිවිල්	80	121	200
විදුලිය	41	60	100
ඉලෙක්ට්‍රොනික්	41	60	100
යාන්ත්‍රික	59	80	100
නාවික	15	20	20
නාවුක	15	20	20
පොලිමර්	22	30	46
රෙදිපිලි	51	60	64
තොරතුරු තාක්ෂණය	-	-	100
මුළු එකතුව	349	482	800

02. <u>නව විෂය ධාරාවන්.</u>

මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනයේ කළමණාකරණ මණ්ඩලය සහ මොරටුව විශ්වවිද්‍යාලීය පාලක මණ්ඩලය මෙම විෂය ධාරාවන් අනුමත කරන ලදි. මෙය තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ආයතන විසින් ද අනුමත කර ඇත. මූලික ඇතුලත් කර ගැනීම සිසුන් 100 ක් වූ අතර 2019 දී ඔවුන් ලියාපදිංචි කර ගන්නා ලදි.

03. <u>වාර ක්‍රමය.</u>

මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනය සිය ජාතික තාක්ෂණ ඩිප්ලෝමා වැඩසටහන සඳහා භෞතික සම්පත් සපයා ගැනීමේ අපහසුව නිසා වාර්ෂික පදනමක් මත පිහිටා

ක්‍රියාත්මක කරන ලදි. තාක්ෂණික ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් කරන ලද විධිමත් අධ්‍යයනයකින් පසු සහ ව්‍යාපෘතියේ සහයෝගය ඇතිව එන්.ඩී.ටී. වැඩසටහන වාර ක්‍රමයට අනුව **2018** වර්ෂය ආරම්භයේ සිට ක්‍රියාත්මක කිරීමට තීරණය විය.

තුන් අවුරුදු ජාතික තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව වාර හයකටත් අධ්‍යයන වාර හතරකටත් පුහුණු වාර දෙකකටත් යොදා ගන්නා ලදි.

04. <u>ජාතික තාක්ෂණික ඩිප්ලෝමා වැඩසටහනට අදාල අධ්‍යයන සම්මාන.</u>

සෑම අධ්‍යයන වාරයකටම අධ්‍යයන සම්මාන **25**ක් සහ සෑම අධ්‍යයන පුහුණු වාරයක් සඳහා ම සම්මාන **06** ක් ද වන අතර ජාතික තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා මුළු සම්මාන **112**ක් වේ.

05. <u>ජාතික තාක්ෂණික ඩිප්ලෝමා විෂය ධාරාවට ඇතුලත් කරන ලද නව අධ්‍යයන ඒකක.</u>

ක්‍රීඩා අධ්‍යයන කටයුතු සහ සෞන්දර්යය අධ්‍යයන කටයුතු ජාතික තාක්ෂණික ඩිප්ලෝමාවට අනිවාර්යය විෂයයන් ලෙස වාර I සහ II දී පූර්ණ වර්ධනයන් සඳහා ඇතුලත් කර ඇත. සමාජයීය සෞඛ්‍ය ආරක්ෂාව නීතිමය සහ සංස්කෘතික කරුණු සහ එයට අදාල වෙනත් කරුණු සහ වගකීම් ඇතුලත් කර ඇත.

ඉංජිනේරුමය යෙදවුම් සමාජයට සහ පරිසරයට ඇති කරන බලපෑම් පිළිබඳව දැනුවත් කිරීම, කණ්ඩායම් වැඩ කිරීම සහ සංනිවේදන කුසලතා වර්ධනය කිරීම සඳහා සියළු ම NDT සිසුන්ට III සහ IV අධ්‍යයන වාරයේ මොඩියුලයක් ලෙස ව්‍යාපෘතියක් හඳුන්වා දී ඇත.

ආර්ථික විද්‍යාව සහ ගණකාධිකරණය NDT වැඩසටහනට ඇතුලත් කර ඇත්තේ ඉංජිනේරු කළමණාකරණය මූලධර්ම අවබෝධය සඳහා සහ ඒවා අනුගමනය කිරීම සඳහා ය.

06. <u>අධ්‍යයන, පරිපාලන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය.</u>

නැවත ස්ථාපිත තාක්ෂණික ආයතනය සඳහා අවශ්‍ය කාර්යය මණ්ඩලය නියමිත සම්පාදනය කරන ලදුව **2017** වර්ෂය සඳහා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමත කර ඇත. පුරප්පාඩු තනතුරු අභ්‍යන්තර මාරු වීම් වලින් සහ උසස් වීම් වලින් මෙන්ම වෙනත් අනුමත ක්‍රම වලින් පුරවා ඇත.

තනතුරු	අනුමත තනතුරු සංඛ්‍යාව	පුරවන ලද තනතුරු සංඛ්‍යාව
අධ්‍යයන	ස්ථිර - 54 තාවකාලික - 36	ස්ථිර - 46 තාවකාලික - 36
පරිපාලන	7	7
වෙනත් මාණ්ඩලික	2	-
අධ්‍යයන සහායක	5	3
අනධ්‍යයන	156	103

07. තත්ව සහතික ඒකකය.

විශ්වවිද්‍යාලප්‍රතිපාදන කොමිෂන් සභාවේ නියමයන්ට අනුකූලව සම්පාදකවරයෙක් යටතේ තත්ව සහතික ඒකකයක් ස්ථාපිත කරන ලදි. සෑම වැඩසටහනක් ම ක්‍රියාත්මක කිරීම තත්ව සටහනක් බවට පත් කෙරෙන අතර උපයෝගී කර ගනු ලබනුයේ ජාතික තාක්ෂණික ඩිප්ලෝමා වැඩ සටහන වාර ක්‍රමයට මාරු වූ පසු එයට අදාල ක්‍රියා මාර්ග තත්ව සහතිකයන්ට අනුකූලව ඒ අවස්ථාවේම මාරු කරන ලදි.

08. සිසුන් සඳහා අභ්‍යන්තර නේවාසිකාගාර පහසුකම් සැපයීම.

දෙවන වසර සිසුන් 480 දෙනෙකුට සහ පළමු වසර සිසුන් 800 දෙනෙකුට නේවාසිකාගාර පහසුකම් සපයා ඇත. සියළුම සිසුන් පරිශ්‍රය අභ්‍යන්තරයේ නේවාසිකව සිටිනු දක්නට ලැබේ. සියළු ම සිසුන් සඳහා පූර්ණ පහසුකම් සහිත ක්‍රීඩාගාරයක් පවතී. ගෘහස්ථ සහ එළිමහන් ක්‍රීඩා පහසුකම් සලසා ඇති අතර පළපුරුදු ක්‍රීඩා උපදේශකවරුන් දෙදෙනෙකුගේ අනුග්‍රහයක් ලබා දී ඇත. සිසුන් සඳහා සහනදායී භෝජනාගාර ක්‍රමයක් පවත්වාගෙන යන අතර ආයතනය භෝජනාගාර දෙකකින් සමන්විත වේ. වෛද්‍ය මධ්‍යස්ථානය සුදුසුකම් ලත් කාර්ය මණ්ඩලයකින් යුතුව ක්‍රියාත්මක වේ. හදිසි අවස්ථාවලදී සහ රාත්‍රී කාල වලදී ක්‍රියාත්මක වන ප්‍රවාහන සේවයකින් ද යුක්ත වේ.

09. මොරටුව විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයට සුභ සාධක පහසුකම් සැපයීම.

ආයතනයේ අවශ්‍යතාවයන් සපුරාලන කාර්ය මණ්ඩලයට නේවාසික පහසුකම් සපයා ඇත. හිස්ව පවතින නේවාසිකාගාර කාමර තුල බොහෝ අධ්‍යයන සහ අනධ්‍යයන සේවක භවතුන්ට නේවාසික පහසුකම් සපයා ඇත. ආයතනයේ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ද පිහිටුවා ඇත. තව ද කාර්ය මණ්ඩල පහසුව සඳහා කාර්ගිල්ස් ෆුඩ්සිටි ආයතනයක් ද පිහිටුවා ඇත.

10. වෙනත් උසස් අධ්‍යාපන ආයතන සඳහා අධ්‍යයන සේවාවන් සැපයීම.

මෙම ව්‍යාපෘතිය මඟින් තාක්ෂණික ආයතනය සඳහා ඉතා හොඳින් සැකසුනු වැඩමුළු සහ රසායනාගාර පහසුකම් ලබා දී ඇත. 2018 වර්ෂය තුල ආයතනයේ අධ්‍යයන කාර්යය මණ්ඩලයේ උපදෙස් පරිදි බොහෝ ඉංජිනේරු හා විද්‍යා මොඩියුලවල ප්‍රායෝගිකව සහ අංග සම්පූර්ණව කැළණිය විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨය සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨය ITUM වැඩමුළු සහ විද්‍යාගාර භාවිතා කර ඇත.

11. සියළු ම ඩිප්ලෝමා සිසුන් සඳහා කෙටි කාලීන කර්මාන්ත අවස්ථා සම්පාදනය.

පළමු වර්ෂයේ අධ්‍යයන කටයුතු සඳහා සියළු එන්.ඩී.ටී. සිසුන් පොදු විෂය ධාරාවක් එකම බාහිර මොඩියුලයක් සමඟ අනුගමනය කරයි. දෙවන වසරේ විෂය ධාරාව ක්ෂේත්‍ර අනුව වෙනස් වේ. එනිසා අධ්‍යයන කාර්ය මණ්ඩලයෙන් අධ්‍යයන වර්ෂ දෙක අතරතුර කාර්මික පුහුණු වාරයක් ඇතුලත් කරන ලෙස අඛණ්ඩව ඉල්ලීමක් විය. ආරම්භක ප්‍රයත්නයක් ලෙස තාක්ෂණික ආයතකයෙහි සියළු ඩිප්ලෝමා සිසුන් හට ඔවුන්ගේ දෙවන වසර අධ්‍යයන කටයුතු වලට පෙර කාල සීමාවක් (දින 1-4) කාර්මික යෙදවීමකට සැලැස්විය.

(ඈ) අසාර්ථක වීම් සහ සාධාරණීයකරණය.

2018 උපාධි ප්‍රධානෝත්සවය නියමිත දින දී නොපැවැත්විණි. 2018/10/24 දින 2014/15 සිසු කණ්ඩායම උපාධි ලැබීමට සුදුසුකම් ලැබූ සිසුන් උපාධි ලබා ගන්නා අවස්ථාවේ පැලඳීමට නව උපාධි ලෝගුවක් අපේක්ෂාවෙන් පැවැත්වීමට නියමිතව තිබූ උපාධි ප්‍රධානෝත්සවයට විරුද්ධ විය.

(ඈ) අනාගත සැලසුම්.

සිසුන් 1000 ඇතුලත් කර ගැනීම සඳහා නව ගොඩනැඟිලි ඉදි කිරීමට ආරම්භ කර ඇත. ඒ නිසා සිසුන් ඇතුලත් කර ගැනීමේ ප්‍රමාණය ක්‍රමයෙන් වැඩි කිරීම සඳහා ක්‍රියා කරනු ඇත.

නව විෂය ධාරාවන් ජාතික තාක්ෂණ ඩිප්ලෝමා වැඩසටහනට ඇතුලත් කර ගැනීම සඳහා තොරතුරු තාක්ෂණය 2019 සිට ඇතුලත් කිරීමට කටයුතු කරනු ඇත.

පශ්චාත් ඩිප්ලෝමා හඳුන්වා දීම තුලින් සමාජයේ හා කර්මාන්තවල අවශ්‍යතා සපුරාලමින් අධ්‍යයන අංශ ඔවුන්ගේ සේවය පුළුල් කරනු ඇත.

(ඉ) තාක්ෂණික ආයතනයේ පහසුකම්.

බහුවිධ සම්මන්ත්‍රණ ශාලාව, කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය, ආගන්තුක නිවාස සහ සාප්පු සංකීර්ණය ආදියෙන් සමන්විත වීම සහ එමඟින් ආයතනයේ ආදායම් තත්වය දියුණු විම.

02. ආයතනයේ අරමුණු

අරමුණ 01 සමාජයේ සහ කර්මාන්තකරණයේ අවශ්‍යතාවයන් සපුරාලිය හැකි වැඩි ශිෂ්‍ය ප්‍රජාවකට නම්‍යතාවයෙන් ලගාවිය හැකි ඉගැන්වීමේ සහ කුසලතා පුහුණු කිරීමේ ක්‍රම වේදයක් නිර්මාණය කිරීම.

අරමුණ 02 ප්‍රායෝගිකව උචිත වන පර්යේෂණ දිරිගැන්වෙන පරිසරයක් ස්ථාපිත කිරීම සහ නව්‍යකරණය සහ නිර්මාණශිලිත්වය සඳහා උනන්දු කරවීම.

අරමුණ 03 අනෝන්‍ය වශයෙන් වාසිදායක ශක්තිමත් වූ හවුල් සබඳතාවයක් කර්මාන්ත අංශයේ ක්ෂේත්‍ර සමඟ ගොඩනැඟීම.

අරමුණ 04 සුදුසුකම් ඇති හා ධෛර්යමත් කාර්ය මණ්ඩලයක් ඇති කිරීම.

අරමුණ 05 ශිෂ්‍යයින්ගේ පූර්ණ සංවර්ධනයක් ප්‍රවර්ධනය කෙරෙන පරිසරයක් නිර්මාණය කිරීම

අරමුණ 06 ආයතනයේ සියළුම ක්ෂේත්‍රයන්හි තත්වය සහ කාර්යක්ෂමතාවය සහතික කෙරෙන කළමනාකරණ පද්ධතියක් වර්ධනය කිරීම.

අරමුණ 07 ආයතනයේ මුදල් තත්වය වර්ධනය කිරීම.

අරමුණ 08 ඉඩ පහසුකම් කළමණාකරණය මඟින් යටිතල පහසුකම් කාර්යක්ෂම ලෙස හා තිරසර ලෙස භාවිතය තහවුරු කිරීම හා නඩත්තුව.

03. ජාතික තාක්ෂණික පාඨමාලාවේ ඉතිහාසය පිළිබඳ කෙටි විස්තරයක් සහ මොරටුව විශ්වවිද්‍යාලය, තාක්ෂණික ආයතනය ස්ථාපිත කිරීම.

ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාවේ (NDT) මුලාරම්භය මරදාන ලංකා කාර්මික විද්‍යාලයේ දී ඇතිවුන අතර එය 1940 ගනන් දක්වා වූ කාලයකට දිව යනු ලැබේ. එහි ලන්ඩන් විශ්වවිද්‍යාලයේ බී.එස්.සී (ඉංජිනේරු) උපාධියට සිසුන් සූදානම් කරන, වර්ෂ හතරක තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාවට අමතරව කනිෂ්ඨ කාර්මික නිලධාරි දෙවර්ෂ පාඨමාලාවන් ක්‍රියාත්මක කරන ලදී. කනිෂ්ඨ කාර්මික නිලධාරී පාඨමාලාව ඉතා හොඳ පිළිගැනිමක් ලද මධ්‍යම මට්ටමේ පාඨමාලාවක් වූ අතර මෙම පාඨමාලාව අවසන් කළ අය රටේ ඉංජිනේරු ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා බොහෝ සෙයින් දායක වූහ.

1960 වර්ෂයේදී මොරටුව, කටුබැද්දෙහි ප්‍රායෝගික තාක්ෂණික ආයතනය පිහිටුවීමත් සමගම කනිෂ්ඨ කාර්මික නිලධාරී (NDT) පාඨමාලාව මරදානේ සිට මොරටුවට මාරුකරන ලදී. කැනඩා රජයේ ආධාර ඇතිව (IPT) පිහිටු වුයේ ප්‍රායෝගික මූලාශ්‍ර සහිත මධ්‍යම මට්ටමේ ඉංජිනේරු තාක්ෂණ පාඨමාලා නිර්මාණය කිරීම සහ ක්‍රියාත්ම කිරීමටය.

1966 වර්ෂයේ දී ප්‍රායෝගික තාක්ෂණික ආයතනය, ලංකා කාර්මික කොලීජිය ලෙස උසස් කරන ලද අතර පාඨමාලා ව්‍යාප්තියත් සමගම වේගවත් සංවර්ධනයක් ද ඇතිවිය. ලංකා තාක්ෂණික කොලීජිය වර්ෂ පහක කාලයක් සඳහා වූ තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාවක් ආරම්භ කරන ලදී. තවද ජේ.ටී.ඕ පාඨමාලාව සංශෝධනය කොට යාන්ත්‍රික පුහුණුවක්ද ඇතුලත් කොට, එය වසර තුනක ජාතික ඩිප්ලෝමා පාඨමාලාවක් බවට පත් කරන ලදී. මේ සංවර්ධන ක්‍රියාකාරීත්වයත් සමඟ, ලංකා තාක්ෂණික (CCT) එකම විශ්වවිද්‍යාලය යටතේ වූ, මණ්ඩපයක් බවට 1972 දී උසස් කරන ලදී. එතැන් සිට උසස් අධ්‍යාපන අමාත්‍යංශය වෙනුවෙන් එන්.ඩී.ටී පාඨමාලාව, විශ්වවිද්‍යාලය විසින් පවත්වනු ලැබීය. 1987 දී එන්.ඩී.ටී පාඨමාලාව, 1978 අංක 16 දරණ පනත අනුව විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාඨමාලාවක් බවට පත්වූ අතර මෙම පාඨමාලාවට ඇතුලත් වීමේ සුදුසුකම් වුයේ ජී.සී.ඊ උසස් පෙළ සමත්වීමය. මොරටුව විශ්වවිද්‍යාලය යටතේ ක්‍රියාත්මකවන (ITUM) 2000 වසරේ අංක 3 දරණ ආඥා පනත යටතේ ස්ථාපිත කරන ලද්දේ NDT සහ එයට සමාන්තර පාඨමාලා මූලික වශයෙන් ක්‍රියාත්මක කිරීමටය. තාක්ෂණික ආයතනය, කළමණාකරන මණ්ඩලයක් යටතේ ක්‍රියාත්මක වන අතර, පාඨමාලාවල ස්වාධීන සංශෝධනයන් සඳහා ඉවහල්වන, භෞතික වශයෙන් වෙන්ව පිහිටුවන ලබන ආයතනයක් ලෙස පිහිටුවීමේ, කාර්ය භාරය ඉටුවීම එම මණ්ඩලයෙන් අපේක්ෂා කෙරේ. JOT / NDT සම්පූර්ණ කරන ලද අය ජාතියේ සංවර්ධන ක්‍රියාවලියට අතිවිශාල වශයෙන් දායකත්වයක් ලබා දෙති, NDT පාඨමාලාවෙන් පුළුල් අධ්‍යාපනයක් සහ පුහුණුවක් ලබා දෙන අතර මධ්‍යම මට්ටමේ කාර්මික කටයුතු ඉටුකිරීමට අවශ්‍ය හැකියාවන්ද ලබාදෙයි. තවද එය වැඩිදුර ශක්තිමත් පදනමක් ද ඇති කරනු ලැබේ. රටේ පවත්නා මධ්‍යම මට්ටමේ පාඨමාලාවල තත්වය මනින මිනුම් දණ්ඩයක් බවටද මනා පිළිගැනීමක් ලෙස එන්.ඩී.ටී පාඨමාලාව පත්ව ඇත.

ජාතික තාක්ෂණ ඩිප්ලෝමා වැඩසටහන පිළිබඳ කෙටි හැඳින්වීමක්

මෙම පාඨමාලාවේ මූලික අරමුණ වනුයේ අප රටෙහි කාර්මික ක්ෂේත්‍රයට අවශ්‍ය වන විවිධ ක්ෂේත්‍රවලට අදාල ඉංජිනේරු ඩිප්ලෝමාධාරීන් බිහිකිරීමය. ආයතනය ජාතික තාක්ෂණ ඩිප්ලෝමා වැඩසටහන, 800 මුළු ශිෂ්‍ය සංඛ්‍යාවකට විෂයධාරා දහයක් යටතේ ක්‍රියාත්මක කරනු ලබයි. අදාල විස්තර පහත සඳහන් පරිදි වේ.

රසායනික ඉංජිනේරු තාක්ෂණය	50
සිවිල් ඉංජිනේරු තාක්ෂණය	200
විදුලිය ඉංජිනේරු තාක්ෂණය	100
විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු තාක්ෂණය	100
නාවික ඉංජිනේරු තාක්ෂණය	20
යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණය	100
නාවුක අධ්‍යයන තාක්ෂණය	20
පොලිමර් තාක්ෂණය	50
පේෂකර්ම හා රෙදිපිලි තාක්ෂණය	60
තොරතුරු තාක්ෂණය	100

මෙයට අමතරව සන්නද්ධ හමුදාවන්ට සහ විශ්වවිද්‍යාල අනධ්‍යයන කාර්‍ය මණ්ඩලය සඳහා ශිෂ්‍යයින් පස් දෙනෙක් ලෙස උපරිම වශයෙන් ඇතුලත් කර ගැනීමට ඉඩ සලස්වනු ඇත.

ජාතික තාක්ෂණ ඩිප්ලෝමා වැඩසටහන සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම එයටම ආවේනික වූ ක්‍රියාවලියක් තුලින් සිදුවේ. රජයේ ගැසට් පත්‍රයේ තෝරාගත් ප්‍රතිපත්ති පත්‍ර සහ වෙබ් අඩවිය තුල පළවන ප්‍රසිද්ධ දැන්වීමක් මගින් අයදුම්පත් කැඳවනු ලැබේ. පසුගිය අ.පො.ස. උසස් පෙළ අඛණ්ඩව තෙවරක් පෙනී සිටි සිසුන් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබති. ඉසෙඩ් ස්කොර් දිස්ත්‍රික්ක / විශේෂ කුසලතා වෙන්කිරීම (විශ්වවිද්‍යාල ඇතුළත් කිරීම් මෙන්) ක්ෂේත්‍ර තේරීම යෝග්‍යතා පරීක්ෂණයෙන් ලබාගත් ලකුණු මත සිදු කෙරේ.

පරිපූර්ණ ඩිප්ලෝමාධාරියකුගෙන් මූලිකව අපේක්ෂා කරනුයේ වෘත්තිමය ඉංජිනේරුවරයකු හෝ කළමනාකරුවකු සහ ක්ෂේත්‍රය / වැඩපල මට්ටමේ ශ්‍රම බලකාය අතර පවත්නා සම්බන්ධීකාරක ලෙස කටයුතු කිරීමයි. මෙම ක්‍රියාදාමය තුලින් ඩිප්ලෝමාධාරියාට තමන් වෘත්තීමය ලෙස හැඩගස්වා ගැනීමටත් සම්බන්ධීකරණ සහ කළමනාකරණ කුසලතාවයන් දියුණු කරගැනීමටත් අවශ්‍ය වේ. ඔහු / ඇය තමා තෝරාගත් විෂය ක්ෂේත්‍රය පිළිබඳ මනා අවබෝධයක් ලබාගත යුතුය. මෙම අවබෝධය තුලින් ඔහු / ඇය වෘත්තීමය ඉංජිනේරුවරයකුගේ නව්‍යකරණය / නිර්මාණ ඇගයීමට හැකිවන අතර තම සහායකයින් සමග අදහස් හුවමාරුකර නව්‍යකරණය / නිර්මාණය යථාර්ථයක් බවට පත්කල හැකිවනු ඇත.

මේ අනුව මෙම පාඨමාලාව වසර දෙකක අධ්‍යයන කාලයකින් සහ සෙමෙස්ටර් 06 කින් ලබා දෙන වසරක කාර්මික පුහුණුවකින් සමන්විත වේ. මූලික හා දෙවන අධ්‍යයන පාඨමාලා මොඩියුලයන් ප්‍රධාන වශයෙන් නිර්මාණය කර ඇත්තේ මූලික විද්‍යාවන් පිළිබඳ ශිෂ්‍යයන්ගේ දැනුම සමනය කිරීම සහ ඒකාබද්ධ කිරීම සහ වැඩිදියුණු කිරීම සහ ඔහු / ඇය තෝරා ගන්නා

විශේෂිත විනය පෙළ හඳුන්වාදීමයි. මෙය ඉංජිනේරු විද්‍යා අභ්‍යාස සඳහා අවශ්‍ය මූලික කුසලතාවයන් හෙළිදරව් කරනු ඇත. (උදා: වැඩපොල තාක්ෂණ ඉංජිනේරු සැලසුම්) එක් විෂය ධාරාවක් සඳහා ශිෂ්‍යයා විසින් තෝරාගනු ලැබූ අධ්‍යයන ක්ෂේත්‍රයට අදාල එකක් හෝ ඊට වැඩි ක්ෂේත්‍ර විෂයයක් ලබාදෙනු ඇත. (උදා: සිවිල් ඉංජිනේරු විෂය ධාරාව සඳහා සිවිල් ඉංජිනේරු අධ්‍යයන අංශය විසින් ගොඩනැගිලි ඉදිකිරීම උගන්වනු ලැබේ.)

පහත සඳහන් කරුණු හේතුවෙන් පළමු වසරේදී ඉංග්‍රීසි භාෂා මොඩියුලය අනිවාර්ය වේ.

1 ඩිප්ලෝමාධාරියකුගේ වෘත්තීයේ දී සංනිවේදන කටයුතු ඉතා වැදගත් කාර්ය භාරයක් ඉටුකරයි. එනිසා සිසුන් තම අවබෝධ කර ගැනීම, කථනය, සහ වාර්තා ලිවීම පිළිබඳ කුසලතාවයන් වැඩි දියුණු කර ගත යුතුය.

2 ජාතික තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව මුළුමුනින්ම ක්‍රියාත්මක කෙරෙනුයේ ඉංග්‍රීසි මාධ්‍යයෙනි. බොහෝ සිසුන් අ.පො.ස. උසස් පෙළ දක්වා තමන්ගේ ඉගෙනීම් කටයුතු කර තිබෙන්නේ සිංහල හෝ දෙමළ මාධ්‍යයෙන් වන හෙයින් ඔවුන්ගේ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීනත්වය පුළුල් පරාසයක් තුල වෙනස් වන අතර භාෂා හැකියාවන් දියුණු කර ගැනීමට ඉඩකඩ පවතී.

තෙවන සහ සිව්වන අධ්‍යයන වාරවල හදාරන විෂයයන් තුල ප්‍රධාන වශයෙන් ඇතුළත් වනුයේ තෝරාගත් අධ්‍යයන ක්ෂේත්‍ර වල ඉංජිනේරුමය න්‍යායාත්මක අධ්‍යයනවල නිරතව සිටිමය.

පස්වන සහ හයවන අධ්‍යයන වාර යොදාගෙන ඇත්තේ කර්මාන්තයෙහි නිරතවී ලබන අත්දැකීම් ලබා ගැනීම සඳහාය. පිලිගත් කර්මාන්ත ආයතනයන්හිදී ලබාදෙන පුහුණුව සංවිධානය කරනු ලබන්නේ සහ අධීක්ෂණය කරනු ලබන්නේ ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු අධිකාරිය (NAITA) සහ මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනයේ කර්මාන්ත පුහුණුව භාර ආචාර්යවරයා විසිනි.

වසර 3 ක ඉගෙනීමෙන් සහ පුහුණුවීමෙන් අනතුරුව සමත්වන සිසුන් හට විශ්වවිද්‍යාලය විසින් අනුමත කර ඇති කුසලතා නිර්නායක අනුව සාමාන්‍ය, සම්මාන හෝ විශිෂ්ඨ වශයෙන් ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව ප්‍රදානය කරනු ලැබේ.

පවත්වා ඇති අධ්‍යයනයන්හි දී හෙළිදරව් වී ඇති පරිදි ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව ලබා සමත් වන්නන් එසේ අධ්‍යයන කටයුතු අවසන් කර වසරක් තුල දී රැකියා නියුක්ත වීම 100% බව පෙන්නුම් කෙරේ.

මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණ අංශයේ දැනට ක්‍රියාත්මක වන විෂය මාලාව 2005 වර්ෂයේ දී පළමු වසර සිසුන් සඳහා හඳුන්වා දුන් අතර දෙවන වසර සිසුන් සඳහා 2006 වර්ෂයේදී හඳුන්වා දෙන ලදි. එහි අරමුණ වූයේ, සිසුන් කර්මාන්ත ලෝකයේ වර්තමාන තාක්ෂණ දියුණුව හා සමගාමීව, ඔවුන් තෝරාගත් විෂයධාරාවන්හි පුළුල් දැනුමක් ලබා දීමයි.

දීර්ඝ කාලසීමාවකට පසුව මොරටුව තාක්ෂණික ආයතනය ප්‍රතිස්ථාපනය සහ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ පසු ජාතික තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාවේ විෂය මාලාව වැඩිදියුණු කිරීමට හා යාවත්කාලීන කිරීමට සහ අධ්‍යාපන පාඨමාලාවන් සඳහා වාර්ෂික ක්‍රමයේ සිට වාර ක්‍රමයට වෙනස් කිරීමකට ලක් කර ඇත.

තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාවේ පළමු වසරේ වැඩසටහන සඳහා 2018 දී අධ්‍යයන වාර ක්‍රමය ක්‍රියාත්මක කරන ලද අතර පාඨමාලාවේ දෙවන වසර සඳහා 2019 වසරේ දී අධ්‍යයන වාර ක්‍රමය ක්‍රියාත්මක කිරීමට තිබේ.

04. ආයතනයේ කළමනාකරණ මණ්ඩලය

1	එම්.එම්.පී.ඩී	සමරසේකර මහත්මිය	අධ්‍යක්ෂ - තාක්ෂණික ආයතනය
2	මාධව	දේවසුරේන්ද්‍ර මහතා	උසස් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්තුමාගේ නාමිත
3	ඒ.ඩබ්	සෙනෙවිරත්න මහතා	නාවික විෂයභාර ඇමතිතුමාගේ අමාත්‍යාංශ ලේකම්තුමාගේ නාමිත
4	ආර්.එම්.ඒ.පී	සමරදිවාකර මහත්මිය	ජාතික ආධුනිකත්ව සහ කර්මාන්ත පුහුණු අධිකාරියේ සභාපතිතුමාගේ නාමිත
5	මහාචාර්ය එන්.	වික්‍රමාරච්චි මහතා	පීඨාධිපති, ඉංජිනේරු පීඨය
6	මහාචාර්ය එම්.එල්	ද සිල්වා මහතා	පීඨාධිපති, වාස්තු විද්‍යා පීඨය
7	ආචාර්ය ටී.ඒ.	පියසිරි මහතා	පාලක සභා නියෝජිත **(2018.05.09 සිට 2021.05.08)**
8	මහාචාර්ය එස්.එම්.ඒ	නානායක්කාර මහතා	සභාතන සභා නියෝජිත **(2016.12.17 සිට 2019.12.16)**
9	එස්.එල්	ජයසූරිය මහත්මිය	මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනයේ අධ්‍යයන මණ්ඩලයේ නියෝජිත
10	සී.පී.එන්.	ආටිගල මහත්මිය	
11	ආචාර්ය ටී.ඒ.ජී	ගුණසේකර මහතා	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා නියෝජිත **(2018.04.30 සිට)**
12	ආචාර්ය ඒ.එම්.එන්.	අලගියවන්න මහතා	
13	මහාචාර්ය ජේ.ආර්	ලූකස් මහතා	

05. ආයතනයේ නිළධාරීන්

අධ්‍යක්ෂ	**එම්.එම්.පි.ඩී සමරසේකර මහත්මිය** *B.Sc. (Eng.) (Moratuwa),* *M. Eng. (Moratuwa),* *MPhil (Moratuwa)*
නියෝජ්‍ය ලේඛකාධිකාරි	**එන්.ඩී. කුරුප්පුආරච්චි මහතා** B. Sc (OUSL) M sc (Sri J'pura) PGDMM (IGNOU) MBA (IGNOU)
ජ්‍යෙෂ්ඨ සහකාර මුල්‍යාධිකාරි	**එස්.පී.ඩී. පිරිස් මහත්මිය** *B.Com (Sp) KLN,* *PGDIP (Pub. Mgt.) SLIDA,* *CBA*
සහකාර ලේඛකාධිකාරී	**එල්. පී. පෙරේරා මහත්මිය** *BA in Social Sciences - OUSL*
	කේ.එච්.ඩබ්. මලේපතිරණ මෙය *BSc in Business Management (HRM)(Special)(NSBM)*
	ආර්.එම්.එච්.ඒ. ලක්මාලි මෙය *BA (Hons)Economics (Colombo)*
සහකාර මුල්‍යාධිකාරී	**ඒ. ලියනගමගේ මහත්මිය** *LICA (Institute of Chartered Accountants of Sri Lanka)*
	පී.ජේ. වීරක්කොඩිආරච්චි මිය *M Bs (Colombo)* *Bsc. Business Administration (Sri J'Pura)* *CBA member (Institute of Chartered Accounted)* *MAAT (Association of Accounting Technicians)*

5.1 සංවිධාන සැලැස්ම - 2018



06. තොරතුරු ලබා ගැනීමේ පහසුකම්

ලිපිනය	තාක්ෂණික ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලය දියගම හෝමාගම ශ්‍රී ලංකාව.	
දුරකතන අංක	අධ්‍යක්ෂක	:011 2124001
	පොදු	:011 2124000
	ෆැක්ස්	:011 2124018
	විද්‍යුත් ලිපිනය	:itum.mrt.ac.lk

07. කාර්ය මණ්ඩල සහ සිසුන් පිළිබඳ විස්තර

අධ්‍යයන අංශ	පාඨමාලාව	මුළු ශිෂ්‍ය සංඛ්‍යාව	මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය	මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලය
සිවිල් ඉංජිනේරු තාක්ෂණය	ජාතික තාක්ෂණික ඩිප්ලෝමා	243	කථිකාචාර්යවරු P –08 V- 03 C-01 උපදේශකවරු T – 07 V-10	P- 06
යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණය සහ නාවුක අධ්‍යයනය	ජාතික තාක්ෂණික ඩිප්ලෝමා	270	කථිකාචාර්යවරු P – 08 C- 02 V- 04 උපදේශකවරු T – 06 V- 29	P- 28
			NDA L– 11 NDA I - 4	
පොලිමර්, රෙදිපිළි සහ රසායනික ඉංජිනේරු තාක්ෂණය	ජාතික තාක්ෂණික ඩිප්ලෝමා	288	කථිකාචාර්යවරු P – 11 V – 09 උපදේශකවරු T – 08 V – 11	P - 13
විදුලිය, ඉලෙක්ට්‍රොනික සහ විදුලි සන්දේශ ඉංජිනේරු තාක්ෂණය	ජාතික තාක්ෂණික ඩිප්ලෝමා	241	කථිකාචාර්යවරු P – 09 V – 01 උපදේශකවරු T – 13 V – 07	T- 09
අන්තර්විෂය මාලා අධ්‍යයනය	ජාතික තාක්ෂණික ඩිප්ලෝමා	350	කථිකාචාර්යවරු P – 11 C – 01 V – 16 උපදේශකවරු T – 03 V – 10	P- 03

P – ස්ථිර
C - කොන්ත්‍රාත්
T - තාවකාලික

V - බාහිර
NDA L -ජාතික ඩිප්ලෝමා සංගමය කථිකාචාර්යවරු
NDA I -ජාතික ඩිප්ලෝමා සංගමය උපදේශකවරු

7.1 දේශීය සිසුන් පිළිබඳ විස්තර

ආයතනයට සිසුන් 481 ක් ඇතුලත් කරගනු ලබන අතර ක්ෂේත්‍ර 10 කින් සමන්විත වේ. එනම් රසායනික, පේෂකර්ම, පොලිමර්, සිවිල්, විදුලිය, විද්‍යුත් හා විදුලි සන්දේශ, නාවික, යාන්ත්‍රික හා නාවුක වේ.

අධ්‍යයන අංශය	පාඨමාලාව	මාධ්‍යය	සිසුන් ඇතුලත් කිරීම 2018	පළමු වසර සිසුන්	දෙවන වසර සිසුන්	තෙවන වසර සිසුන්	උපාධිධාරීන් සංඛ්‍යාව
සිවිල් ඉංජිනේරු තාක්ෂණ.	ජාතික තාක්ෂණික ඩිප්ලෝමා	ඉංග්‍රීසි	121	121	79	81	79
යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණය සහ නාවුක අධ්‍යයනය	ජාතික තාක්ෂණික ඩිප්ලෝමා	ඉංග්‍රීසි	120	120	82	88	91
පොලිමර්, රෙදිපිළි සහ රසායනික ඉංජිනේරු තාක්ෂණය	ජාතික තාක්ෂණික ඩිප්ලෝමා	ඉංග්‍රීසි	120	117	93	83	98
විදුලිය, ඉලෙක්ට්‍රොනික සහ විදුලි සන්දේශ ඉංජිනේරු තාක්ෂණය	ජාතික තාක්ෂණික ඩිප්ලෝමා	ඉංග්‍රීසි	120	120	80	79	73
අන්තර්විෂය මාලා අධ්‍යයනය	ජාතික තාක්ෂණික ඩිප්ලෝමා	ඉංග්‍රීසි		480	350	350	
එකතුව			481	958	684	681	341

7.2 අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල පිළිබඳ විස්තර (2018.12.31)

කාර්ය මණ්ඩල වර්ගය	වැටුප් පරිමාණය	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවන සංඛ්‍යාව	පුරප්පාඩු
අධ්‍යයන කාර්ය මණ්ඩලය	U-AC 3 to U-AC 5	54	46	08
	U-AC 1 to U-AC 2	36	29	07
ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය	U-EX 1 to U-EX 3 (Administrative & Financial Staff)	07	07	-
	U-EX 1 to U-EX 3 (Other Executive Staff)	01	-	01
අධ්‍යයන සහයක කාර්ය මණ්ඩලය	U-AS 1	07	02	05
	U-AS 2,2	03	01	02
තාක්ෂණික කාර්ය මණ්ඩලය	U- MT 1	33	16	17
ලිපිකරු හා සමාන	U-MN 1	38	30	08
	U-MN 2,3	04	01	03
	U-MN 4	-	-	-
ප්‍රාථමික කාර්ය මණ්ඩලය	U-PL 1 to U-PL 3	78	53	25

08. පර්යේෂණ, නව නිපැයුම් සහ ප්‍රකාශන පිළිබඳ විස්තර

මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණ ආයතනයේ කාර්ය මණ්ඩලය විසින් කරන ලද පර්යේෂණ කටයුතු වල සොයාගැනීම් දේශීය සහ විදේශීය වශයෙන් ඉදිරිපත් කර ඇති අතර හා ප්‍රකාශිතව ඇත.

ලේඛකවරු	පත්‍රිකාවේ මාතෘකාව	සම්මන්ත්‍රණය
භද්‍රානී තෝරදෙණිය. බසන්ත් මහේෂ්වරී	එලදායී පාර්ශවකරුවන් සඳහා ජල කළමණාකරණය නායකත්වය සඳහා වූ උපාය මාර්ග හා රාමුව :සමාලෝචනය	New water policy and Practice Journal, Policy Studies Organization, Vol 4 (2), 2018
අයෝධ්‍යා බුලත්සිංහල භද්‍රානී තෝරදෙණිය	post 'rathupaswala issue'. Neighboring community perceptions of groundwater	Engineer, The Institution of Engineers, Sri Lanka, 2018, Vol Li (4), pp. (85-94)
ඩබ්.එල්.එස් . මධුරංග සී.එස්.ලෙවන්ගමගේ	විවිධ සුළං ආරෝපණ ක්ෂේත භාවිත කිරීම, ශ්‍රී ලංකාව සඳහා සුළි ආරෝපන සිතියම් සංවර්ධනය කිරීම.	ENGINEERING, The Institution of Engineers, Sri Lanka – Vol. LI,No.03,pp. (41-49), 2018
ජී.ඩබ්.ටී.සී.කණ්ඩම්බි	Use of cement Stabilized Rammed Earth for Load Bearing Wall with Appropriate Finishes – Case Study'	International Journal of Current Engineering and Technology, Vol 8, no.2, March/ April 2018
ජී.ඩබ්.ටී.සී.කණ්ඩම්බි	ක්ෂේත්‍ර අධ්‍යයනය තුලින් ඉගෙනීම වැඩි දියුණු කිරීම	Journal of Technology and Science Education, Vol. 8, No. 4, May 2018.
ජී.ඩබ්.ටී.සී.කණ්ඩම්බි	Practice of Classroom Assessments for Learning.	International Journal of Sciences: Basic and Applied Research, Vol. 41, No. 1, 2018
අයෝධ්‍යා බුලත්සිංහල භද්‍රානී තෝරදෙණිය	post 'rathupaswala issue'. Neighboring community perceptions of groundwater	ENGINEER, The Institution of Engineers, Sri Lanka – Vol. L, No.04, pp. (85-94), 2018
ජේ.එම්.පී. ගුණසේකර	Design and performance of 60 ^{0} F redundant upper limb exoskeleton with passive compliance	2018/08/28
පී.ඩී.සී. කුමාර එම්.පී.එස්. විරාජ් එස්.කේ.කේ.සුරවීර එච්.එච්.ඊ.ජයවීර ඒ.එම්. මුසාතික් ටී.ආර්. ආරියරත්න	Solar thermal energy harnessing using a parabolic trough concentrator, in 03rd International Computing and Technology (ICACT 2018), Colombo	2018/07/26

පර්යේෂණ, නව නිපැයුම් සහ ප්‍රකාශන පිළිබඳ විස්තර

ලේඛකවරු	පත්‍රිකාවේ මාතෘකාව	සම්මන්ත්‍රණය
පී.ඩී.සී. කුමාර එම්.පී.එස්. විරාජ් එච්.එච්.ඊ.ජයවීර ටී.ආර්. ආරියරත්න	Construction and evaluation of a thermal energy storage system designed for a concentrating solar thermal energy plant, in Annual Research Symposium – University of Colombo, University of Colombo	2018/11/09
ඩබ්.පී.එස්.කේ. පෙරේරා	**Use of Feynman Technique as peer teaching to facilitate deeper student learning**	2018/07/26
එස්.බී.වයි. අබේවර්ධන එස්. පෙරේරා කේ.එම්.එන්. ද සිල්වා එස් . වල්පොලගේ එම්.සී.ඩබ්. සෝමරත්න	පරිමාණ හා තිරසාර ලෙස භාවිතා කළ හැකි ඉලෙක්ට්‍රොනික උපාංග සඳහා සන්නායක ස්ථානගත කිරීම	American Journal of Nano science & Nanotechnology Research, 6(1) (2018)36-45
එස්.බී.වයි. අබේවර්ධන එස්. පෙරේරා කේ.එම්.එන්. ද සිල්වා එස් . වල්පොලගේ එම්.සී.ඩබ්. සෝමරත්න	Betonies Nano clay assisted hydrophilic nylon fabrics	**Chemical Science International Journal, 23(2) (2018) 1-6**
කෝකිලා අබේකෝන් ජුලියන් නානායක්කාර එච්. පුංචිහේවා	Usability study for validating Warm mapping framework	2018/08/27 ITUM Research Symposium
කේ.එම්.ඩබ්. අබේකෝන්	A framework development using Ergonomic principles and modified Pre-determined motion time system (PMTS) to increase the ability of physically Disable population	Initial submission of the PhD thesis was made on 14/11/2018
ජී.කේ. ජයතුංග බී.එම්.ඩබ්.පී.කේ. අමරසිංහ	Effect of drying temperature in spouted bed drying on quality of blackpepper	ITUM research Symposium 2018. September 2018
එම්.සී.ඩබ්. සෝමරත්න ජේ.එස්. ගයාෂානි එස්.කේ.ටී. තත්සරා ඒ.ආර්.එම්. අබේවර්ධන	Rate of Reduction of Swollen Diameter of Films Cast From XNBR Compounded Latex	6^{th} Annual Research Symposium ITUM, 4-49

පර්යේෂණ, නව නිපැයුම් සහ ප්‍රකාශන පිළිබඳ විස්තර

ලේඛකවරු	පත්‍රිකාවේ මාතෘකාව	සම්මන්ත්‍රණය
පී.එච්.ජී.පෙරේරා එන්.ජේ.ජී.ජේ. බන්ඩාර එම්.ඩබ්.ජයවීර එම්.සී.ඩබ්. සෝමරත්න බී.තත්සර ගුණවර්ධන ජේ.එම්.ඒ. මනතුංග	Migration of Phthalic Acid Esters from Pet Water Bottles: Implications of Reusing Empty Bottles for Storing Ambient and Warm Water for Subsequent Consumption.	23rd International Forestry and Environment Symposium, 74
එස්.බී.වයි. අබේවර්ධන එස්.පෙරේරා කේ.එම්.එන්. ද සිල්වා එස්.වල්පලගේ එම්.සී.ඩබ්.සෝමරත්න	පරිමාණ හා තිරසාර ලෙස භාවිතා කළ හැකි ඉලෙක්ට්‍රොනික උපාංග සඳහා සන්නායක ස්ථානගත කිරීම	American Journal of Nano science & Nanotechnology Research, 6(1) (2018) 36-45
එස්.බී.වයි. අබේවර්ධන එස්. පෙරේරා කේ.එම්.එන්. ද සිල්වා එස්. වල්පලගේ එම්.පී.ඩබ්.සෝමරත්න	Bentonite nanoclay assisted hydrophilic nylon fabric	Chemical Science International Journal, 23 (2) (2018) 1-6
පී.එස්. යටපාන එම්.ආර්. සූරියආරච්චි	Comparability of the effect of Re-scrutinizing on two University selection methods Z score and common Currency Index method (CCI) in Sri Lanka	International journal of advanced Research in Engineering and Management (IJAREM) ISSN: 2456-2033//PP 50-58
පී.එස්. යටපාන එම්.ආර්. සූරියආරච්චි	Solution to subject comparable problems in parallel Examination: Common Currency Index (CCI) method	IRES International Conference, Brisbane, Australia 8th - 9th August 2018
එස්. සපරමාදු සමන් බන්ඩාර	Optimum positions for frictions between service centers to minimize passenger delays.	ප්‍රවාහන පද්ධතියේ සිද්ධි අධ්‍යයනය
එස්. සපරමාදු චාමලී හේවාවසම්	A need of new methodology to side walk assessment in Sri Lanka	එකොළොස්වන ජාත්‍යන්තර සම්මේලනය - FARU 2018
සපරමාදු එස්. සමන් බණ්ඩාර චාමලී හේවාවසම් උදය අබේසිංහ	ශ්‍රී ලංකාවේ ආපදා තත්වය සඳහා වර්ෂාපතනය පුරෝකතනය කරන ගණිතමය මාදිළි	ගණිත හා සංඛ්‍යාලේඛණ පිළිබඳ ජාත්‍යන්තර සභරාව **EPH**
සී.එස්. මතුගම ඒ.කේ.ඩී.කේ. චතුරංගි	තාක්ෂණික පාඨමාලා පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාවක් හැදෑරීමේ හැකියාව පිළිබඳ ශිෂ්‍යයන්ගේ දැනුම, කුසලතා සහ ආකල්ප සංවර්ධනය කිරීම	මොරටු විශ්වවිද්‍යාල තාක්ෂණික පර්යේෂණ සම්මන්ත්‍රණය - 2018
ඩී.ඒ. ජයකොඩි කේ.කේ.ටී.කේ. විජිතසේන එස්. වීරසිංහ	Prevalence of Menstrual Irregularities among National Level Female Athletics and Factors Associated with Menstrual Irregularities.	11 වන ජාත්‍යන්තර සමුළුව ශ්‍රී ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය

පර්යේෂණ, නව නිපැයුම් සහ ප්‍රකාශන පිළිබඳ විස්තර

ලේඛකවරු	පත්‍රිකාවේ මාතෘකාව	සම්මන්ත්‍රණය
ඩී.ඒ. ජයකොඩි කේ.කේ.ටී.කේ. විජිතසේන එස්. වීරසිංහ	The Association between Dietary Intake, Eating Disorders and Menstrual Irregularities of National Level Female Athletics in Sri Lanka	ශාරීරක අධ්‍යාපනය පිළිබඳ අට වන ජාත්‍යන්තර සමුළුව තායිලන්තය, බැංකොක්
කෞෂිකා ප්‍රේමරත්න	Exploring the Reasons for the fossilization of Phonological Errors: A case study of the substitution of /for /by English as Second Language Learners in Sri Lanka	Advanced in Language and Literary Studies ISSN: 223-4714
කෞෂිකා ප්‍රේමරත්න	The effect of explicit corrective feedback on phonological intelligibility	ISOR Journal of Humanities and Social Science (IOSR-JHSS) e-ISSN: 2279-0837
කල්පනා ගලප්පත්ති මොහොමඩ් ඉස්කන්දර් පෙට්‍රා	A rational design of high efficient and low-cost dye sensitizer with exceptional absorptions: Computational study of cyaniding based organic sensitizer.	Journal of Solar Energy

09. වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර

	වැඩසටහන් සම්මනත්‍රණ/වැඩමුළු	පැවැත්වුණු දින	සහභාගී වූවෝ	අදහස් දැක්වීම්
සිවිල් ඉංජිනේරු අංශය	මැනුම් හා මට්ටම් ඉංජිනේරුකරණය	01 ජූනි 2018 03 ජූනි 2018	සියළු ම අධ්‍යයන හා අනධ්‍යයන විද්‍යාගාර කාර්ය මණ්ඩලය	
	විෂයමාලා සංශෝධන වැඩමුළුව	29 සැප්තැම්බර් 2018	සියළු ම අධ්‍යයන හා අනධ්‍යයන තාක්ෂණික කාර්ය මණ්ඩලය	
	වාර්ෂික මිණුම් කඳවුර	නොවැම්බර් 2018	එන්.ඩී.ටී. සිවිල් ඉංජිනේරු සිසුන්	ජාත්‍යන්තර පුහුණු ආයතනය-කොත්මලේ
	තිරසාරව ඉදිකළ පරිසරය පිළිබඳ ජාත්‍යන්තර සමුළුව	13 – 15 දෙසැම්බර් 2018	ජී.ඩබ්.ටී.සී. කණ්ඩම්බි මිය	
	පාංශු ක්‍රියාකාරීත්වයන් පිළිබඳ න්‍යායන් සහ භාවිතයන්	19 දෙසැම්බර්, 2018	සියළු ම අධ්‍යයන හා අනධ්‍යයන තාක්ෂණික කාර්ය මණ්ඩලය	
විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු තාක්ෂණය	Curriculum revision workshop to overview the syllabus revision and to get suggestions in collaboration with academic and industrial representative.	18 අගෝස්තු 2018	අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ කාර්මික නියෝජිතයන්	
	විදුලි සංදේශ ක්ෂේත්‍රයේ තාක්ෂණය පිළිබඳ සිසුන් දැනුවත් කිරීම සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ සහයෝගය ඇතිව සංවිධානය කළ වැඩමුළුව	ඔක්තෝබර්, 2018	අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ දෙවන වසර විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු සිසුන්	
	වෘත්තීය සංවර්ධනය පිළිබඳ වැඩමුළුව A workshop on career development was organized with the participation of Industrial expertise as resource person	සැප්තැම්බර්, 2018	අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ දෙවන වසර විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු සිසුන්	

වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර

	වැඩසටහන් සම්මනත්‍රණ/වැඩමුළු	පැවැත්වුණු දින	සහභාගී වූවෝ	අදහස් දැක්වීම්
විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු තාක්ෂණය	ශ්‍රී ලංකා මහජන උපයෝගීතා සභාවේ වගකීම් සම්බන්ධව ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව හා එක්ව විදුලිබල ගුණාත්මකභාවය සහ විශ්වසනීයත්වය පවත්වාගෙන යාමේ වැඩමුළුව	28 ජුනි, 2018	අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ දෙවන වසර විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු සිසුන්	
පේෂකර්ම හා රෙදිපිළි තාක්ෂණය	සුරක්ෂා වැඩමුළුව	22 මැයි 2018	අදාල අංශයේ අධ්‍යයන හා අනධ්‍යන කාර්යය මණ්ඩලය	
	බලසම්පන්න ඉදිරිපත් කිරීම් සකස් කිරීම හා ඉදිරිපත් කිරීම	27 සැප්තැම්බර් 2018	පළමු වසර සහ දෙවන වසර එන්.ඩී.ටී. පේෂකර්ම සිසුන්	
	ශීතකරණ සහ වායු සමීකරණ පද්ධති	11 ඔක්තෝබර් 2018	එන්.ඩී.ටී. දෙවන වසර සිසුන්	
	ව්‍යාපෘති කළමණාකරණය TPM, and OEE	22 ඔක්තෝබර්, 2018	එන්.ඩී.ටී. දෙවන වසර සිසුන්	
	ඉලක්ක සැකසුම් සහ කර්මාන්ත අවශ්‍යතා	25 ඔක්තෝබර් 2018	එන්.ඩී.ටී. පළමු වසර සිසුන්	
	සම්පූර්ණ තත්ව කළමණාකරණය	29 ඔක්තෝබර් 2018	එන්.ඩී.ටී. දෙවන වසර සිසුන්	

වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර

	වැඩසටහන් සම්මන්ත්‍රණ/වැඩමුළු	පැවැත්වුණු දින	සහභාගී වූවෝ	අදහස් දැක්වීම්
අන්තර් විෂය අධ්‍යයන අංශය	වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණය	28 අගෝස්තු 2018	අධ්‍යයන කාර්ය මණ්ඩලය	ප්‍රධාන ආරාධිත අමුතත්තා - මහාචාර්යය එන් . වික්‍රමාරච්චි පීඨාධිපති - ඉංජිනේරු පීඨය, මොරටුව විශ්වවිද්‍යාල

10. ආයතනයේ විවිධ ක්‍රියාකාරකම්

ලේ දන් දීමේ කඳවුර

ශිෂ්‍ය ක්‍රියාකාරකම්

ඉෆ්තාර්

සිංහල හා හින්දු අලුත් අවුරුද්ද

කාර්ය මණ්ඩලයේ ක්‍රියාකාරකම්

අයිස්ක්‍රීම් දන්සල

කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන්

11. ලැබුණු ප්‍රදානයන් පිළිබඳ විස්තර

ඩිප්ලෝමා ප්‍රදාන උත්සවයේ දී විශිෂ්ඨ සාමාර්ථ ලබා ගත් සිසුන් සංඛ්‍යාව.

රසායන ඉංජිනේරු තාක්ෂණය	**03**
සිවිල් ඉංජිනේරු තාක්ෂණය	**03**
විදුලි ඉංජිනේරු තාක්ෂණය	**04**
ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු තාක්ෂණය	**05**
නාවික ඉංජිනේරු තාක්ෂණය	**05**
යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණය	**03**
නාවුක අධ්‍යයනය	**05**
පොලිමර් තාක්ෂණය	**06**
රෙදිපිළි ඉංජිනේරු තාක්ෂණය	**05**

2018 වසරේ සම්මාන ප්‍රධානෝත්සවය තවමත් සිදු කර නොමැති අතර විශිෂ්ඨ සාමාර්ථ ලබා ගත් සිසුන් සංඛ්‍යාව ශ්‍රේණිගත කිරීමේ ලයිස්තුවෙන් ලබා ගෙන ඇත.

12. පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර

විෂයය		2017 රුපියල්	2018 රුපියල්
අ.	පෞද්ගලික වැටුප් සහ වේතන	147,176,334.00	253,149,642.00
ආ.	ගමන් වියදම්	157,562.00	357,886.00
ඇ.	සැපයීම්	7,496,517.00	10,032,623.00
ඈ.	නඩත්තු කටයුතු	1,968,917.00	4,951,505.00
ඉ.	ගිවිසුම් ගත සේවා	45,675,282.00	87,800,857.00
ඊ.	වෙනත්	11,318,891.00	9,204,684.00
එකතුව		**213,793,567.00**	**347,497,215.00**

13. ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර

විෂයය		2017 රුපියල්	2018 රුපියල්
අ.	දැව භාණ්ඩ රසායනාගාර සහ කාර්යාල උපකරණ මිල දී ගැනීම	953,410.00	660,976,00
ආ.	යන්ත්‍ර සහ මැෂින් මිල දී ගැනීම	-	-
ඇ.	ගොඩනැගිලි සහ ව්‍යුහයන් අත් පත් කර ගැනීම	-	-
ඈ.	වෙනත්	545,656.00	2,527,090.00
එකතුව		**1,499,066.00**	**3,188,066.00**

14. ව්‍යාපෘති අරමුදල් පිළිබඳ විස්තර (දේශීය / විදේශීය අරමුදල්)

නම	මුළු පිරිවැය රුපියල්	2017 වැය රුපියල්	2018 වැය රුපියල්	එකතු කළ වැය 31.12.2018	% භෞතික සංවර්ධනය
දියගම පරිශ්‍රයේ නැවත ස්ථාපිත කෙරෙන මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනය		10,360,051.00	ව්‍යාපෘතිය අවසන් වී ඇති බැවින් දියගම ඉදි කිරීම් ගිණුමේ සිට ප්‍රාග්ධන ගිණුමට මාරු වී ඇත.		
එකතුව		**10,360,051.00**			

15. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වැය)

විෂයය		ප්‍රතිපාදන 2018 රුපියල්	වියදම 2018 රුපියල්	ඉතිරිය/අතිරික්තය රුපියල්
අ.	පුනරාවර්තන ව්‍යාපෘතිය හැර	267,500,000.00	347,497,215.00	(79,997,215.00)
ආ	මූලධන ව්‍යාපෘති හැර	6,470,000.00	3,188,066.00	3,281.934.00
එකතුව		**273,970,000.00**	**350,685,281.00**	**(79,715,281.00)**

16. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (උපයන ලද ආදායම)

ආදායමේ ස්වභාවය		ප්‍රතිපාදන 2018 රුපියල්	එකතු වීම් 2018 රුපියල්	ඌනතාවය/අතිරික්තය රුපියල්
අ.	අභ්‍යන්තර අදායම	17,895,000.00	5,904,137.00	11,990,863.00
එකතුව		**17,895,000.00**	**5,904,137.00**	**11,990,863.00**

17. මූල්‍ය ක්‍රියාකාරීත්වය සමාලෝචනය - 2018

විෂයය		ක්‍රමය	ඒක ශිෂ්‍ය වියදම
අ.	ඒක ශිෂ්‍ය පුනරාවර්තන වැය	පු. වැය ශිෂ්‍ය සංඛ්‍යාව	301,385.00
ආ.	ඒක ශිෂ්‍ය මූලධන වැය	මූ. වැය ශිෂ්‍ය සංඛ්‍යාව	2,765.00
එකතුව			**304,150.00**

18. තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම

SDG 04 ගුණාත්මක අධ්‍යාපනය

තිරසාර සංවර්ධනය 2030 න්‍යාය පත්‍රයට තිරසාර සංවර්ධන ඉලක්ක 169 ක් ඇතුළත් වේ. අදාළ අංක 04 යටතේ ඇතුළත් සහ සාධාරණ හා ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරාම ඉගෙනීමේ අවස්ථා ප්‍රවර්ධනය කිරීම විශ්වවිද්‍යාලහා උසස් අධ්‍යාපන ආයතන සමඟ කෙලින්ම සම්බන්ධ වේ. ඒ අනුව පහත සඳහන් ප්‍රධාන ප්‍රතිපත්ති හඳුනාගෙන ඇත.

1. උසස් අධ්‍යාපනයට ප්‍රවේශ ඇති කිරීම
2. උසස් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය හා අදාළත්වය
3. කළමනාකරණ පද්ධතිවල ප්‍රමාණවත් බව
4. පර්යේෂණ, නවෝත්පාදන සහ දැනුම හුවමාරු කිරීම

තිරසාර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීම හා සාක්ෂාත් කර ගැනීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිර්දේශ කර ඇති පරිදි ඉහත සඳහන් ප්‍රධාන ප්‍රතිපත්ති හතර මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනය විසින් සැලසුම් කර හෝ ක්‍රියාත්මක කර ඇති ආකාරය මෙහි සාරාංශ වශයෙන් දක්වා ඇත. ඒ අනුව, මෙම ප්‍රතිපත්ති මඟින් තිරසාර සංවර්ධන අරමුණු අංක 4 හි 4.3, 4.4, 4.5 සහ 4.A ඉලක්ක ආවරණය කරනු ඇත. ඉලක්ක පහත ලැයිස්තුගත කර ඇත (DCS 2017).

ඉලක්කය 4.3: 2030 වන විට සියලුම කාන්තාවන්ට සහ පිරිමින් සඳහා දැරිය හැකි පිරිවැයක් යටතේ ගුණාත්මක අධ්‍යාපනයක් විශ්වවිද්‍යාලය ඇතුළු තාක්‍ෂණික, වෘත්තීය හා තෘතීයික ක්ෂේත්‍ර යටතේ සහතික කිරීම.

ඉලක්කය 4.4: 2030 වන විට යහපත් රැකියා සහ ව්‍යවසායක අවස්ථා වෙනුවෙන් තාක්ෂණික හා වෘත්තීය කුසලතා ඇතුළුව අදාළ කුසලතා ඇති තරුණ හා වැඩිහිටියන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු ලෙස වැඩි කිරීම.

ඉලක්කය 4.5: 2030 වන විට අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ විෂමතා ඉවත් කිරීම සහ සියලු මට්ටමේ අධ්‍යාපන හා වෘත්තීය පුහුණුව සඳහා සමාන ප්‍රවේශයක් සහතික කිරීම හා අවදානමට ඇති අවස්ථා ඉවත් කිරීම.

ඉලක්කය 4.A: ළමයින්, ආබාධිතභාවයට පත්වූවන් සහ ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ ගැටළු මතු නොවන මට්ටමේ අධ්‍යාපන පහසුකම් ගොඩනැගීම සහ වැඩිදියුණු කිරීම සහ සැමට සුරක්ෂිත හා සාමකාමී පරිසරයක අධ්‍යාපනය ලැබීමේ පරිසරයන් සැපයීම.

පරිසරය සුරැකීම සම්බන්ධයෙන් ආයතනික සංවර්ධන සැලසුම ක්‍රියාත්මක කිරීමේ දී තිරසාර සංවර්ධනයේ අරමුණු යටතේ වන ක්‍රියාකාරකම් ද සිදුකරනු ලැබීම පහත සඳහන් භාවිතාවන් මඟින් තවදුරටත් සහතික කෙරේ.

1. හරිත පරිසරය ආරක්ෂා කිරීම හා සංරක්ෂණය කිරීම
2. පිරිසිදු කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය කිරීම තුළින් අපජල කළමනාකරණය
3. කසළ හා අපද්‍රව්‍ය බැහැර කිරීම කළමනාකරණය කිරීම

19. විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන

තාක්ෂණික ආයතනනය මොරටුව විශ්වවිද්‍යාලය
2018 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

වත්කම්	සටහන්	2017 (රුපි)	2017 (රුපි)	2018 (රුපි)	2018 (රුපි)
ජංගම වත්කම්					
බැංකුවේ ඇති මුදල්	1	9,633,528		5,658,407	
ලැබිය යුතු දෑ	2	13,094,194		12,616,776	
තොගය		1,812,967		2,182,393	
පෙර ගෙවීම්	3	400,940		1,232,187	
අයෝජන (කෙටිකාලීන)		0	**24,941,629**	0	**21,689,763**
ජංගම නොවන වත්කම්					
අයෝජන (දිගුකාලීන)	4	19,082,110		13,973,244	
දේපල පිරියත හා උපකරණ	5	10,076,377,354		9,643,990,664	
කෙරිගෙන යන වැඩ	5(a)	43,462,119		0	
වෙනත් වත්කම්	6	1,355,149		2,674,427	
			10,140,276,732		**9,660,638,335**
මුළු වත්කම්			**10,165,218,361**		**9,682,328,098**
බැරකම්					
ජංගම බැරකම්					
ගෙවිය යුතු දෑ	7	12,165,602		22,091,133	
අත්හිටවු අදායම්	8	3,031,349		7,816,969	
උපචිත වියදම්	9	19,321,529	34,518,480	47,202,196	77,110,298
ජංගම නොවන බැරකම්					
පාරිතෝෂික ගෙවීම් සදහා ප්‍රතිපාදන			24,782,579		35,086,184
මුළු බැරකම්			**(59,301,059)**		**(112,196,482)**
මුළු ශුද්ධ වත්කම්			**10,105,917,302**		**9,570,131,616**
ශුද්ධ වත්කම් / හිමිකම්					
වැයවු මුලධන ආධාර	10	10,036,984,632		9,625,105,118	
කෙරිගෙන යන වැඩ ප්‍රාග්ධන ගිණුම	10(a)	71,640,819		0	
වැයනොවු මුලධන ආධාර	11	11,525,214		14,798,158	
පොදු සංචිතය	12	(55,307,685)		(126,726,352)	
පරිත්‍යාග	13	4,093,286		4,093,286	
මූල්‍ය නොවන රාජ්‍ය දීමනා	14	7,250,000		7,250,000	
ඒකරාශි වු අරමුදල	15	22,271,443		27,305,985	
ශේෂ අතිරික්තය		7,459,593		18,305,421	
			10,105,917,302		**9,570,131,616**
මුළු ශුද්ධ වත්කම් / හිමිකම්			**10,105,917,302**		**9,570,131,616**

පිටු 33 සිට 37 දක්වා ඇති සටහන් මූල්‍ය ප්‍රකාශන වලට අයත් කොටසකි. මෙම මුදල් ප්‍රකාශන පිළියෙල කිරීමෙන් ඉදිරිපත් කිරීමක් කළමනාකරන මණ්ඩලයේ වගකීම් වේ. ආයතනයේ කළමනාකරන මණ්ඩලය වෙනුවෙන් අනුමත කොට අත්සන් තබන ලද්දේ:-

අක/ එම්.එම්.පී.ඩි සමරසේකර මිය	අක/ එස්.එම්.ඒ.නානායක්කාර මයා	අක/ එස්.පී.ඩී පිරිස් මිය	අක/එන්.ඩී.කුරුප්පුආරච්චි මයා
අධ්‍යක්ෂතුමිය	සමාජික / කළමනාකරණ මණ්ඩලය	ජෙ.ස මුල්‍යාධිකාරි	ජ්‍යෙෂ්ඨ සහකාරලේඛකාධිකාරි

තාක්ෂණික ආයතනනය මොරටුව විශ්වවිද්‍යාලය

2018 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

මෙහෙයුම් අදායම	සටහන	2017 (රුපි)	2018 (රුපි)
පුනරාවර්තන ආධාර		169,854,000	267,500,000
රජයේ ආධාර - මහපොළ		4,910,000	6,171,000
රජයේ ආධාර - ශිෂ්‍යාධාර		17,897,100	16,664,600
වෙනත් අදායම්	**16**	6,405,142	5,904,137
ක්‍රමක්ෂය		7,142,998	651,438,105
වෙනත් ආධාර		5,200,000	3,499,000
පර්යේෂණ දිරිගැන්වීමේ ආධාර		206,225	81,985
නායකත්ව සංවර්ධන දීමනාව			
ශිෂ්‍ය කේන්ද්‍ර අධ්‍යයන දීමනාව			
හැකියාව වර්ධනය සඳහා ආධාර		26,730	208,465
		211,642,195	**951,467,292**
මෙහෙයුම් වියදම්			
පෞද්ගලික වැටුප් හා වේතන	**17**	147,176,344	235,149,644
ගමන් වියදම්	**18**	157,562	357,886
සැපයුම් හා පරිභෝජන ද්‍රව්‍ය	**19**	7,496,517	10,032,623
නඩත්තු කිරීමේ වියදම්	**20**	1,968,971	5,753,384
ගිවිසුම් සේවා	**21**	45,675,282	87,800,875
පර්යේෂණ හා සංවර්ධන වියදම්	**22**	472,775	259,406
කාලය සහ ක්‍රමක්ෂය වියදම්		6,897,170	651,438,105
වෙනත් මෙහෙයුම් වියදම්	**23**	10,846,116	10,167,213
මහපොළ		4,910,000	6,171,000
ශිෂ්‍යාධාර		17,897,100	16,664,600
පර්යේෂණ දිරිගැන්වීමේ වියදම්		206,225	81,985
හැකියාව වර්ධනය කිරීමේ වියදම්		26,730	208,465
නව ස්ථානගතකිරීම් සහ සංවර්ධනය ව්‍යාපෘති වියදම්		10,360,051	186,661
මුළු මෙහෙයම් වියදම්		**254,090,843**	**1,024,271,853**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ඇතිවුනු අතිරික්තය / ඌනතාවය		**(42,448,648)**	**(72,804,561)**
වත්කම් ඉවත් කිරීමේදී ලත් ලාභය		**0**	**(1,509,286)**
		(42,448,648)	**(74,313,847)**

අක / එස්.පී.ඩී පීරිස් මිය

ජ්‍යෙෂ්ඨසහකාරමූල්‍යාධිකාරී

තාක්ෂණික ආයතනය මොරටුව විශ්වවිද්‍යාලය
2018 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

	සටහන	10	10a	11	12	13	14	15		
		වැයවූ මූලධන ආධාර	ඉඩම සඳහා ගෙවීම්	වැයනොවූ මූලධන ආධාර	පොදු සංචිතය	පරිත්‍යාග	මුදල් නොවන රජයේ ආධාර	එක්රැස්වූ අරමුදල	ශේෂ අතිරික්තය	මුළු මුදල
2016 දෙසැම්බර් 31 දිනට ශේෂය		21,689,481	71,640,819	7,024,280	(13,533,842)	4,093,286	7,250,000	20,864,977		119,029,001
මූල්‍ය ප්‍රගති ප්‍රකාශන වල සඳහන් නොවූ ශුද්ධ ලාභ සහ පාඩු					674,805				7,459,593	8,134,398
මාරු කිරීම් / ශුද්ධ චලනයන්		10,022,438,149		4,500,934				1,406,466		10,028,345,549
කාල සීමාව තුල අතිරික්තය / ඌනතාවය					(42,448,648)					(42,448,648)
ක්‍රමක්ෂය		(7,142,998)								(7,142,998)
2017.12.31දිනට ශේෂය		10,036,984,632	71,640,819	11,525,214	(55,307,685)	4,093,286	7,250,000	22,271,443	7,459,593	10,105,917,302
දේපල ප්‍රත්‍යාගනනයෙන් පසු අතිරික්තය / ඌනතාවය										
මාරුකිරීම් ශුද්ධ චලනයන්		167,924,534		3,272,944				5,034,542		176,232,020
මූල්‍ය ප්‍රගති ප්‍රකාශනයන්හි සඳහන් නොවූ ශුද්ධ ලාභ සහ පාඩු		(6,763)			2,895,180				10,845,828	13,734,245
ක්‍රමක්ෂය		71,640,819	(71,640,819)							(651,438,104)
අදාල කාලය සඳහා අතිරික්තය / ඌනතාවය		(651,438,104)			(74,313,847)					(74,313,847)
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය		9,625,105,118	0	14,798,158	(126,726,352)	4,093,286	7,250,000	27,305,985	18,305,421	9,570,131,616

අක / එස්.පී.ඩී පීරිස් මිය /ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී

තාක්ෂණික ආයතනනය මොරටුව විශ්වවිද්‍යාලය

2018 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ සටහන

මෙහෙයුම් ක්‍රියාකාරීත්වයන් තුල මුදල් ප්‍රවාහයන්	සටහන්	2017		2018	
		රුපි	රුපි	රුපි	රුපි
අතිරික්තය / ඌනතාවය සාමාන්‍ය ක්‍රියාකාරීත්වය තුලින්		(42,448,648)		(74,313,847)	
<u>මුදල් නොවන සංචලනය</u>					
ක්ෂය වීම්		6,897,170		651,438,105	
ක්‍රමක්ෂය		(7,142,998)		(651,438,105)	
අතිරික්තය / (ඌනතාවය) පාරිතෝෂික වෙන්කිරීම්		3,223,700		10,303,605	
වෙනත් ගැලපීම්	25	1,464,305		2,895,180	
වත්කම් ඉවත්කිරීමේදී ලත් ලාභය		0		1,509,286	
<u>අතිරික්තය / (ඌනතාවය) කාරක ප්‍රාග්ධනය</u>					
(ඌනතාවය / අතිරික්තය) ලැබීම්	26	(3,153,998)		(723,255)	
අතිරික්තය / (ඌනතාවය) අත්හිටවූ ආදායම		2,948,789		4,785,620	
අතිරික්තය / (ඌනතාවය) ගෙවීම්	27	6,096,266		9,925,531	
(ඌනතාවය) / අතිරික්තය උපචිත වියදම්		15,493,059		27,880,667	
මෙහෙයුම් ක්‍රියාවන් තුලින් ශුද්ධ මුදල් ප්‍රවාහය			(16,624,356)		(17,737,213)
<u>ආයෝජන මුදල් ප්‍රවාහය</u>					
යාන්ත්‍රෝපකරන සහ උපකරණ මිලදී ගැනීම් (උපලේඛන ඩී සහ ඊ)		(1,266,111)		(2,819,766)	
ඉඩම් සඳහා ගෙවීම් (ප්‍රාග්ධන)					
වෙනත් ව්‍යාපෘති සඳහා ගෙවීම්		(232,955)		290,450	
වත්කම් විකිනීම		0		258,900	
ආයෝජන වැඩිකිරීම					
ආයෝජන ක්‍රියා තුලින් ශුද්ධ මුදල් ප්‍රවාහය			(1,499,066)		(2,851,316)
<u>මූල්‍යමය ක්‍රියාකාරකම් තුල මුදල් ප්‍රවාහය</u>					
මුලධන ආධාර	11	6,000,000		6,470,000	
අතිරික්තය / ඌනතාවය විශේෂිත අරමුදල්		1,406,466		5,034,542	
අතිරික්තය / ඌනතාවය ආධාර		0			
මූල්‍ය කටයුතු තුලින් ශුද්ධ මුදල් ප්‍රවාහය			7,406,466		11,504,542
ශුද්ධ අතිරික්තය / (ඌනතාවය) මුදල් සහ මුදල් සමතාව			(10,716,956)		(9,083,987)
අදාල කාලය ආරම්භයේ මුදල් සහ මුදල් සමතාව			39,432,594		28,715,638
අඩු ආයෝජන			28,715,638		19,631,651
			(19,082,110)		13,973,244
අදාල කාලය අවසානයේ මුදල් සහ මුදල් සමතාව	28		9,633,528		5,658,407

අක / එස්.පී.ඩී පීරිස් මිය (ජ්‍යෙෂ්ඨ සහකාර මුල්‍යාධිකාරී)

- **(මූල්‍ය සටහන්වලට අදාල සියලු විස්තර ඉංග්‍රීසි පිටපතෙහි දක්වා ඇත)**

20. විගණන කමිටු වාර්තාව

<u>අභ්‍යන්තර විගණන වාර්තාව.</u>

විගණන කමිටුව සහ කළමණාකරණ මණ්ඩලය අනුමත කරන ලද විගණකාධිපතිතුමාගේ එකඟත්වය ඇතිව විගණන වැඩ සටහන අනුව විශේෂිත වැඩ කොටස් ආවරනය වන පරිදි මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනයේ විගණන කටයුතු 2018 වර්ෂයේ දී ද පහත සදහන් පරිදි ඉටු කරන ලදි.

1. <u>පූර්ව විගණනය.</u>

- විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් නිදහස් කිරීම (UPF)
- පාරිතෝෂික මුදල් ගෙවීම.
- විශ්‍රාම වැටුප් අරමුදලෙන් විශ්‍රාම වැටුප් නිදහස් කිරීම.
- බැදුම්කර ගණනය කිරීම.

2. <u>හඳුනා ගැනීම් මත විගණන විමසුම් නිකුත් කිරීම.</u>

- ස්ථාවර වත්කම් වල වැරදි නිවැරදි බව පරීක්ෂා කිරීම.
- පුනරාවර්තන වියදම් පරීක්ෂා කිරීම
- බැංකු සැසඳුම් පරීක්ෂා කිරීම
- මිශ්‍ර අත්තිකාරම් පරීක්ෂා කිරීම
- කාර්ය මණ්ඩල ණය සාම්පල පරීක්ෂා කිරීම
- මිල දී ගැනීම් සහ ඉදි කිරීම
- සුළු මුදල් කළමණාකරණය තහවුරු කිරීම
- තාක්ෂණික ආයතනයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ කාලීන වාර්තාව

3. <u>විගණන කමිටුව</u>

මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනයේ විගණන කමිටුව, ක්‍රියාකාරකම් සමාලෝචනය සඳහා තෙමසකට වරක් රැස් වේ. විගණකාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන විගණන වාර්තා , විගණන විමසීම් සහ ඒවා පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීම් විගණන කමිටුව විසින් සලකා බලනු ලැබේ.

අදාල වර්ෂය තුල දී විගණන කමිටුව අවස්ථා හතරක දී රැස් ව ඇත.

5. <u>කාර්ය මණ්ඩලය</u>

තාක්ෂණික ආයතනයේ අභ්‍යන්තර විගණන කටයුතු මොරටුව විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකගේ අධීක්ෂණය යටතේ ආයතනය විසින් පත් කර ඇති විගණන සහකාර විසින් සිදු කරනු ලැබේ. මොරටුව විශ්ව විද්‍යාලයේ අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩලය ද ආයතනයෙහි විගණන කටයුතු සිදු කිරීම සඳහා ඔවුන්ගේ සහාය ලබා දෙයි.

21. විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. HED/C/ITUM/6/18/FA
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2019 මැයි 31 දින

අධ්‍යක්ෂ

තාක්ෂණික ආයතනය මොරටුව විශ්වවිද්‍යාලය

මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

Institute of Technology
Director's Office
06 JUN 2019
D-59(U)
University of Moratuwa

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

1.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත අනුගමනය කිරීම

(අ) ස්ථාවර වත්කම්වල ඵලදායි ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 11,993,585 ක් වූ දේපළ, පිරියත හා උපකරණ 2018 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත්, තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ හේතුවෙන් ක්ෂය අනුපාත ඇස්තමේන්තු කිරීමේදී වූ දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ආයතනය විසින් බාහිර ආයතනයකට විරුද්ධව රු.මිලියන 05 ක වන්දි ඉල්ලා මොරටුව දිස්ත්‍රික් අධිකරණයේ නඩුවක් පවරා ඇති අතර එම නඩුවේ විත්ති පාර්ශවය විසින් එම නඩුව සම්බන්ධව මහාධිකරණයට ඇපෑලක් ඉදිරිපත් කර තිබුණි. මේ සම්බන්ධයෙන් රා.අ.ගි.ප්‍ර අංක 08 අනුව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී. ලං .රා.ගි.ප්‍ර.අ.02 අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතු නමුත් ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) දේපළ, පිරියත හා උපකරණ, අස්පෘශ්‍යයන් සහ අනෙකුත් දිගුකාලීන වත්කම් අත්පත් කර ගැනීමට මුදල් ගෙවීම හා එකී වත්කම් විකිණීමෙන් මුදල් ලැබීම් වෙන් වශයෙන් හෙළිදරව් කළයුතු අතර ආයෝජන මිලදී ගැනීම හා විකිණීම මත මුදල් ප්‍රවාහයෙහි ශුද්ධ පදනමට වාර්තා කිරීම අවශ්‍ය වේ. 2018 වර්ෂය තුළ රු.5,712,172 ක ස්ථාවර ආයෝජන තැන්පතු නිදහස් කිරීම හා රු.603,306 ක ආයෝජන පොළී වටිනාකම නැවත ආයෝජන කිරීම මත රු.5,108,867 ක ශුද්ධ ආයෝජන වටිනාකම, ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත මුදල් ගලා ඒමක් ලෙස දක්වා නොතිබුණි.

(ii) 2018 වර්ෂයේ මෙහෙයුම් කටයුතුවලින් ජනිත ඌනතාවය කෙරෙහි බලපෑමක් නොවන 2017 වර්ෂයේ මෙහෙයුම් ආදායම් වියදම් ගිණුම්ගත කිරීමේ දෝෂයන් නිවැරදි කිරීම වෙනුවෙන් සිදුකළ රු.2,895,180 ක ශුද්ධ ගැලපුම් වටිනාකම සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය නොවන සංචලනයන් යටතේ දක්වා තිබුණි. ඒ හේතුවෙන් මෙහෙයුම් කටයුතුවලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය රු.2,895,180 කින් වැඩිවී තිබුණි.

(iii) 2018 වර්ෂයේ පාරිතෝෂික වෙන්කිරීම් වියදම වූ රු.11,095,168 ක වටිනාකම මූල්‍ය නොවන සංචලන යටතේ මුදල් ගලා ඒමක් ලෙස හා මුදලින් දැරූ රු.791,562 ක පාරිතෝෂික ගෙවීම මුදල් ගලා යාමක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ වෙන වෙනම ඉදිරිපත් නොකර මූල්‍ය නොවන සංචලනයන් යටතේ එහි ශුද්ධ අගය රු.10,303,605 ක මුදල් ගලා ඒමක් ලෙස ඉදිරිපත් කර තිබුණි.

(iv) උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් තාක්ෂණ ආයතනය වෙත ප්‍රතිස්ථාපන හා සංවර්ධන ව්‍යාපෘතිය වෙත රු.1,500,000 ක් ලෙස හා සෞන්දර්යාත්මක කටයුතු වෙනුවෙන් රු.700,000 ක් ලෙස ලැබුණ රු.2,200,000 ප්‍රදානයන් අදාළ අරමුණු වෙනුවෙන් වැයකර තිබුණ අතර , එම මුදල් ගලායාම මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ ඉදිරිපත් කර නොතිබීමෙන් ආයෝජන ක්‍රියාකාරකම් මත ජනිත මුදල් ප්‍රවාහය රු.2,200,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

1.2.2 අනෙකුත් ගිණුම්කරණ අඩුපාඩු

විස්තර පහත පරිදි වේ.

(අ) වර්ෂය තුළ නේවාසිකාගාර ගාස්තු ලෙස ලැබුණු රු.6,303,404 ක් වර්ෂයේ ආදායමක් ලෙස හඳුනාගෙන නොතිබුණු අතර එම මුදල විලම්භිත ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) තාක්ෂණ ආයතනය විසින් කෙටිකාලීන පාඨමාලා පැවැත්වීම, උපදේශනාත්මක සේවා සැපයීම් සහ වෙනත් උසස් අධ්‍යාපන ආයතනවල ප්‍රායෝගික පැවරුම් සිදු කිරීම යන සේවා තුළින් සමාලෝචිත වර්ෂය තුළදී ජනිත වූ ආදායම රු. 4,402,087 ක් හා වියදම රු. 3,805,568 ක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ වෙන වෙනම දැක්විය යුතු වුවත් මුළු ලැබීම් හා ගෙවීම් අතර වෙනස වූ රු.596,519 ක් විලම්භිත ආදායම් ලෙස ගිණුම්ගත කිරීම පමණක් සිදු කර තිබුණි.

(ඇ) විදුලිය සඳහා 2017 දෙසැම්බර් මාසය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී ගෙවන ලද රු. 2,104,236 ක මුදල සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදමක් ලෙස ගැනීමෙන් සමාලෝචිත වර්ෂයේ විදුලිය වියදම රු.2,104,236 ක් වැඩියෙන් දක්වා තිබූ අතර වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) තාක්ෂණික ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෛද්‍ය මධ්‍යස්ථානයේ විවිධ තොග අයිතම් මූල්‍ය ප්‍රකාශන තුල හෙළිදරව් කළයුතු වුවත්, එම ශේෂය සත්‍යාපනය කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) <u>පසුගිය වර්ෂයයේදී සිදුකල ගිණුම්කරණමය දෝෂ නිවැරදි නොකිරීම</u>

(i) 2018 වර්ෂය තුළ ප්‍රතිස්ථාපන හා සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් ලැබුණ රු.3,499,000 ක ප්‍රදානයක් , අයභාර ආදායම් ලෙසද , එකී ව්‍යාපෘතිය වෙනුවෙන් දැරූ රු.186,667 ක වියදමක් අයභාර වියදමක් ලෙසද සැලකීම හේතුවෙන් 2018 වර්ෂයේ මෙහෙයුම් කටයුතු මත ඌනතාවය රු.3,312,333 කින් අඩුවී තිබුණි.

(ii) දියගම ප්‍රතිෂ්ඨාපන හා සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් 2017 වර්ෂය තුළ දරන ලද රු.11,767,051 ක පිරිවැය කෙරීගෙන යන වැඩ යටතේ දක්වා නොතිබුණ අතර ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස හඳුනාගෙන තිබීම හා මෙම වැයකිරීම වෙනුවෙන් 2017 වර්ෂයේදී ලැබුණ රු.5,000,000 ක ප්‍රදානයන් හා මෙහෙයුම් ආදායම් ලෙස ගිණුම්ගත කිරීමෙන් වූ දෝෂය සමාලෝචිත වර්ෂයේදී ද නිවැරදි නොකිරීමෙන් එකතු ඌනතාවය රු.5,360,051 කින් වැඩියෙන් දක්වා තිබීම හා කෙරීගෙන යන වැඩ ගිණුම රු. 11,767,051 කින් අඩුවෙන් දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම් ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වූවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, මෙම වාර්තවේ 1.2.2 (ඉ) ඡේදයේ සඳහන් නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට විශ්වවිද්‍යාලය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බනධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව **පහත සඳහන් නිරීක්ෂණ** හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූලනොවන ලෙසජ ක්‍රියා කර ඇති බව.

	නීති, රීති /විධානයට යොමුව	විස්තරය
(අ)	විශ්වවිද්‍යාල පනතේ අංක 45 (2) (1) (xv) ප්‍රකාරව	විශ්වවිද්‍යාලයට අයත් කවර මුදලක් වුවද නීත්‍යානුකූලව ආයෝජනය කල හැකි යම් සුරැකුම්පතක අයෝජනය කිරීම හෝ කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන යම් බැංකුවක ස්ථාවර තැන්පත් මුදලක් ලෙස තැන්පත් කල යුතු වුවද වටිනාකම රු.3,082,004 ක් වූ අරමුදල් 06 ක් කිසිදු ආයෝජන කටයුත්තකට යොදා නොගෙන තාක්ෂණික ආයතනයේ ජංගම ගිණුමෙහි රදවා ගෙන තිබුණු බව නිරීක්ෂණය ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ)	මුදල් රෙගුලාසි 757(ඇ) 2 (අ)	2018 වර්ෂය වෙනුවෙන් භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත් 2019 මැයි 10 දිනවන තෙක් එම වාර්තා විගණනයට ඉදිරිපත් නොකෙරුණි.
(ඇ)	මුදල් රෙගුලාසි 445	සෑම ගිණුමක් සඳහාම මුදල් පොත් පවත්වාගෙන යා යුතු වුවත් තාක්ෂණ ආයතනයේ අංක 83062337 දරන රැස්කිරීමේ ගිණුම වෙනුවෙන් මුදල් පොතක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඞ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඟ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව **පහත සඳහන් නිරීක්ෂණ** හැර ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) 2018 වර්ෂයේ රු.4,270,000 ක ප්‍රාග්ධන ලැබීම් අවසාන ගිණුම් තුළ රු.6,470,000 ක් ලෙස දක්වා තිබුණ අතර ඒ තුළ වාර්ෂික අයවැය ප්‍රතිපාදනයන් නොවන උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ප්‍රතිස්ථාපන හා සංවර්ධන ව්‍යාපෘතිය හා සෞන්දර්යාත්මක කටයුතු වෙනුවෙන් ලබාදී තිබුණ රු.2,220,000 ප්‍රතිපාදනයන්ද අන්තර්ගතව තිබුණි. එමෙන්ම 2018 වර්ෂයේ ලැබුණ රු.4,270,000 ක ප්‍රාග්ධන ප්‍රතිපාදන අතුරින් රු.2,250,000 ක ප්‍රතිපාදනයන් 2018 වර්ෂය අවසන් වන තෙක්ම අයභාර බැංකු ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ආ) භාණ්ඩාගාරයෙන් වර්ෂ කිහිපයක සිට ලැබී තිබුණ ප්‍රාග්ධන ප්‍රදාන සමාලෝචිත වර්ෂය ආරම්භයේදී රු. 11,525,214 ක් හා සමාලෝචිත වර්ෂය තුළ රු.6,470,000 ක් ලෙස එකතුව රු.17,995,214 ක් විය. මෙම වර්ෂය තුළ ඉන් උපයෝජනය කර තිබූ ප්‍රතිපාදනය රු.3,197,057 ක් වූයෙන් උපයෝජනය නොවූ ප්‍රතිපාදන ප්‍රමාණය රු. 14,798,158 ක් විය.

(ඇ) 2018 වර්ෂය තුළදී , අරමුදල් ස්ථාපිත කිරීමේදී ඇතිකරගත් අරමුණු වලට පටහැනිව තාක්ෂණ ආයතනයේ මෙහෙයුම් වියදම් පියවා ගැනීම සඳහා අරමුදල් 03 ක ස්ථිර තැන්පත් ලෙස ආයෝජනය කර තිබූ රු.5,688,895 ක මුදලක් ආපසු ලබා ගෙන තිබුණි.

(ඈ) 2018 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.8,125,524 ක් වූ අරමුදල් 03 ක් එම අරමුදල් ස්ථාපිත කල දින සිට වසර 12 ක් දක්වා කිසිදු කාර්යයක් සඳහා යොදා ගැනීමකින් තොරව අක්‍රියව පැවතුණ අතර වටිනාකම රු.2,070,147ක් වූ අරමුදල් 04 ක් සඳහා මුදල් බැර කිරීම සිදු කර තිබුණද වසර 10 කට වැඩි කාලයක සිට එම අරමුදල් තුලින් අපේක්ෂිත අරමුණු සඳහා මුදල් වැය කිරීමකින් තොරව ඌන උපයෝජිතව පැවතුණි.

(ඉ) සිසුන් වෙනුවෙන් ශිෂ්‍යත්ව පිරිනැමීමේ අරමුණින් ස්ථාපිත කර තිබුණු ශිෂ්‍යත්ව අරමුදල් 18 ක් අතුරින් එකතුව රු. 1,383,072 ක්වූ අරමුදල් 13 කින්ම සමාලෝචිත වර්ෂය තුලදී කිසිදු ශිෂ්‍යත්වයක් පිරිනමා නොතිබුණි.

(ඊ) විදුලි බිල්පත් නියමිත දිනට ගෙවීම් නොකිරීම හේතුවෙන් රු.477,009 ක දඩ මුදලක් සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණි.

(උ) 2018 වර්ෂය සඳහා තාක්ෂණික ආයතනය විසින් ඉලක්ක 07 ක් යටතේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර තිබුණු අතර එම ඉලක්ක ළඟා කර ගැනීමේ ප්‍රගතිය පිළිබඳ පරික්ෂා කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) පර්යේෂණ සිදු කිරීම තුළින් නවෝත්පාදන හා නිර්මාණශීලීත්වය ඉහළ නැංවීමේ අරමුණින් සමාලෝචිත වර්ෂය තුළ රු.1,750,000 ක අයවැය ප්‍රතිපාදන වෙන්කර පර්යේෂණ වාර්තා 57 ක් ඉදිරිපත් කිරීමට සැලසුම් කර තිබුණද 2018 වර්ෂය තුලදී පර්යේෂණ වාර්තා 31 ක් පමණක් ඉදිරිපත් කර තිබුණු අතර ඒ සඳහා වැය කරන ලද මුදල රු.215,872 ක් විය.

(ii) සමාලෝචිත වර්ෂය තුළ රු.3,000,000 ක අයවැය ප්‍රතිපාදන වෙන්කර අධ්‍යයන, පරිපාලන හා අනධ්‍යයන කාර්යමණ්ඩලය වෙනුවෙන් සංවර්ධන වැඩසටහන් 03 බැගින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් තිබුණි. එහෙත් 2018 වර්ෂය තුළදී රු.114,000 ක් වැය කර අධ්‍යයන හා අනධ්‍යයන කාර්යමණ්ඩලය වෙනුවෙන් සංවර්ධන වැඩසටහන් 02 බැගින් ක්‍රියාත්මක කර තිබුණද පරිපාලන කාර්යමණ්ඩලය වෙනුවෙන් කිසිදු වැඩසටහනක් ක්‍රියාත්මක කර නොතිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(iii) ශිෂ්‍යයන්ගේ පෞරෂත්ව සංවර්ධනය සඳහා නව පද්ධතියක් හඳුන්වාදීමේ අරමුණින් 2018 වර්ෂය තුළදී ශිෂ්‍ය සංවර්ධන ඒකකයක් ස්ථාපිත කිරීම , නායකත්ව සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ වෘත්තීය මාර්ගෝපදේශන අංශයක් ස්ථාපිත කිරීම යන ක්‍රියාකාරකම් සැලසුම් කර තිබුණද 2018 දෙසැම්බර් 31 දින වන විටද ස්ථාපිත කර නොතිබුණි.

(iv) තාක්ෂණ ආයතනය තුළ ඵලදායි කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS) සංවර්ධනය කිරීම සඳහා 2016 වර්ෂයේ සිට සැලසුම් කර තිබුණද 2018 දෙසැම්බර් 31 දින වන විටද එම පද්ධතියේ මූලික සකස් කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පැවතියද පද්ධතියෙන් අපේක්ෂිත කාර්යයන් ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණි.

3 වෙනත් නිරීක්ෂණ

(අ) 2018 දෙසැම්බර් 31 දිනට තාක්ෂණ ආයතනයේ අනුමත කාර්යමණ්ඩලය 258 ක් වූ අතර තත්‍ය ස්ථිර කාර්යමණ්ඩලය 188 ක් සහ තාවකාලික පදනම මත බඳවාගත් කාර්යමණ්ඩලය 16 දෙනෙක් විය. එම අනුමත හා තත්‍ය කාර්යමණ්ඩලය සැසඳීමේදී මුළු පුරප්පාඩු සංඛ්‍යාව 54 ක් වූ අතර එම පුරප්පාඩු අධ්‍යයන, අධ්‍යයන සහායක සහ අනධ්‍යයන කාර්යමණ්ඩලවල පිළිවෙලින් 03 ක්,07 ක් සහ 44 ක් විය.

(ආ) තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව විශ්වවිද්‍යාලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් දැනුවත් වී තිබුණද ඒ පිළිබඳ වාර්ෂික අයවැයට ඇතුළත් කිරීම, සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කිරීම, කාර්යසාධන දර්ශක හා කාර්යසාධනය මනින සංධිස්ථාන හඳුනාගෙන නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

22. විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු

මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණික ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්ථාව සඳහා පිළිතුරු සැපයීම.

විගනන මතය	පැහැදිලි කිරීම් / ගෙන ඇති ක්‍රියාමාර්ග
1.1 තත්වාගණනය කළ මතය	**1.1** තත්වාගණනය කළ මතය
1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම	**1.2** තත්වාගණනය කළ මතය සඳහා පදනම
1.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කිරීම (අ) ස්ථාවර වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. **11,993,585** ක් වූ දේපළ පිරියත හා උපකරණ **2018/12/31** දිනට සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත්, තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ක්ෂය අනුපාතය ඇස්තමේන්තු කිරීමේ දී ඇති වූ දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත **03** ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි	**1.2.1** ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කිරීම (අ) තොරතුරු තාක්ෂණ උපකරණ රු. **431,250.00** **2018** ඔක්තෝබර් මස පැවති භාණ්ඩ වෙන්දේසියේ දී විකුණන ලදි. ස්ථාවර වත්කම් වල ඵලදායී ජීවිත කාලය අවසන් වීමෙන් පසු තව දුරටත් ප්‍රයෝජනයට ගනු ලබන ස්ථාවර වත්කම්වල වටිනාකම ප්‍රත්‍යාගණනය කර **2019** වර්ෂයේ දී ඉදිරිපත් කරනු ලබන වාර්ෂික ගිණුම් වාර්තා වල ඇතුලත් කිරීමට පියවර ගැනීමට සටහන් තබා ගන්නා ලදි.
(ආ) ආයතනය විසින් බාහිර ආයතනයකට විරුද්ධව රු. මිලියන **05** ක වන්දි ඉල්ලා මොරටුව දිස්ත්‍රික් අධිකරණයේ නඩුවක් පවරා ඇති අතර එම නඩුවේ විත්ති පාර්ශවය විසින් එම නඩුව සම්බන්ධව මහාධිකරණයට ඇපෑලක් ඉදිරිපත් කර තිබුණි.මේ සම්බන්ධව රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත **08** අනුව මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.	(ආ) නෛතික සිද්ධි සම්බන්ධයෙන් ඉදිරි වර්ෂය සඳහා වාර්ෂික ගිණුම් වාර්ථා ඉදිරිපත් කිරීමේදී එය සටහන් වශයෙන් ඉදිරිපත් කිරීමට අදාල නිළධාරීන් දැනුවත් කොට ඇත.
(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක **02** අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතු නමුත් ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. **(i)** දේපළ පිරියත හා උපකරණ, අස්පෘශ්‍යයන් සහ අනෙකුත් දිගු කාලීන වත්කම් අත්පත් කර ගැනීමට මුදල් ගෙවීම හා එකී වත්කම් විකිණීමෙන් මුදල් ලැබීම් වෙන් වශයෙන් හෙළි දරව් කල යුතු අතර ආයෝජන මිල දී ගැනීම හා විකිණීම මත මුදල් ප්‍රවාහයෙහි ශුද්ධ පදනමට වාර්තා කිරීම අවශ්‍ය වේ. **2018** වර්ෂය තුල රු. **5,712,172** ක ස්ථාවර ආයෝජන තැන්පතු නිදහස් කිරීම හා රු. **603,306** ක ආයෝජන පොළී වටිනාකම නැවත ආයෝජන කිරීම මත රු. **5,108,867** ක ශුද්ධ ආයෝජන වටිනාකම, ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත මුදල් ගලා ඒමක් ලෙස දක්වා නොතිබුණි.	(ඇ) **(i)/(ii)/(iii)/(iv)** මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සම්බන්ධයෙන් අදාල ගැලපීම් සොයා බලා නිවැරදි කිරීමට අදාල නිලධාරීන් දැනුවත් කරන ලදි.

විගනන මතය	පැහැදිලි කිරීම් / ගෙන ඇති ක්‍රියාමාර්ග
1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම	**1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම**
1.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කිරීම **(ii)** **2018** වර්ෂයේ මෙහෙයුම් කටයුතු වලින් ජනිත ඌණතාවය කෙරෙහි බලපෑමක් නොවන **2017** මෙහෙයුම් ආදායම් වියදම් ගිණුම්ගත කිරීමේ දෝශයන් නිවැරදි කිරීම වෙනුවෙන් සිදු කළ රු. **2,895,180** ක ශුද්ධ ගැලපුම් වටිනාකම සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය නොවන සංචලනයන් යටතේ දක්වා තිබුණි. ඒ හේතුවෙන් මෙහෙයුම් කටයුතු වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය රු. **2,895,180** කින් වැඩි වී තිබුණි. **(iii)** **2018** වර්ෂයේ පාරිතෝෂික වෙන් කිරීම් වියදම් වූ රු. **11,095,168** ක වටිනාකම මූල්‍ය නොවන සංචලන යටතේ මුදල් ගලා ඒමක් ලෙස හා මුදලින් දැරූ රු. **791,562** ක පාරිතෝෂික ගෙවීම මුදල් ගලා යාමක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල වෙන වෙනම ඉදිරිපත් නොකර මූල්‍ය නොවන සංචලනයන් යටතේ එහි ශුද්ධ අගය රු. **10,303,605** කින් වැඩි වී තිබුණි. **(iv)** උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් තාක්ෂණ ආයතනය වෙත ප්‍රතිස්ථාපන සහ සංවර්ධන ව්‍යාපෘතිය වෙත රු. **1,500,000** ක් ලෙස හා සෞන්දර්යාත්මක කටයුතු වෙනුවෙන් ලැබුණු රු. **2,200,000** ප්‍රදානයන් අදාල අරමුණු වෙනුවෙන් වැය කර තිබුණු අතර, එම මුදල් ගලා යාම මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල ඉදිරිපත් කර නොතිබීමෙන් ආයෝජන ක්‍රියාකාරකම් මත ජනිත මුදල් ප්‍රවාහය රු. **2,200,000** කින් වැඩියෙන් දක්වා තිබුණි.	**1.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කිරීම**
1.2.2 අනෙකුත් ගිණුම්කරණ අඩුපාඩු	**1.2.2 අනෙකුත් ගිණුම්කරණ අඩුපාඩු**
(අ) වර්ෂය තුල නේවාසිකාගාර ගාස්තු ලෙස ලැබුණු රු. **6,303,404** ක් වර්ෂයේ ආදායමක් ලෙස හඳුනාගෙන නොතිබූ අතර එම මුදල විලම්භිත ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.	(අ) මෙම මුදල මෙලෙස ආදායමට නොගෙන විලම්භිත ආදායමක් ලෙස පෙන්වා ඇත්තේ විගණන කමිටුවෙන් ලද උපදෙස් පරිදි නේවාසිකාගාර නඩත්තු කටයුතු සඳහා රඳවා ගැනීමටය. කෙසේ වෙතත් ආයතනයේ සියලු අරමුදල් වලට නිර්ණායක සකස් කරමින් සිටින අතර මෙම අරමුදල ද එහි ඇතුලත්ව ඇත.
(ආ) තාක්ෂණ ආයතනය විසින් කෙටිකාලීන පාඨමාලා පැවැත්වීම, උපදේශනාත්මක සේව සැපයීම සහ වෙනත් උසස් අධ්‍යාපන ආයතන වල ප්‍රායෝගික පැවරුම් සිදු කිරීම යන සේවා තුලින් සමාලෝචිත වර්ෂයේ දී ජනිත වූ ආදායම රු. **4,402,087** ක් හා වියදම රු. **3,805,568** ක් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ වෙනවෙනම දැක්විය යුතු වුවත් මුළු ලැබීම සහ ගෙවීම අතර වෙනස වූ රු. **596,519** ක් විලම්භිත ආදායම ලෙස ගිණුම්ගත කිරීම පමණක් සිදු කර ඇත.	(ආ) ඔබ විසින් පෙන්වා දී ඇති කෙටි කාලීන පාඨමාලා පැවැත්වීම, උපදේශනාත්මක සේවා සැපයීම් සහ වෙනත් උසස් අධ්‍යාපනආයතනවල ප්‍රායෝගික පැවරුම් සඳහා ආදායම් සහ වියදම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ දැක්වීමට සටහන් තබා ගන්නා ලදි.

විගනන මතය	පැහැදිලි කිරීම් / ගෙන ඇති ක්‍රියාමාර්ග
1.2.2 අනෙකුත් ගිණුම්කරණ අඩුපාඩු	**1.2.2 අනෙකුත් ගිණුම්කරණ අඩුපාඩු**
(ඇ) විදුලිය සඳහා 2017 දෙසැම්බර් මාසය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී ගෙවන ලද රු. 2,104,236 ක මුදල සමාලෝචිත වර්ශයේ පුනරාවර්තන වියදමක් ලෙස ගැනීමෙන් සමාලෝචිත වර්ෂයේ විදුලි වියදම රු. 2,104,236 ක් වැඩියෙන් දක්වා තිබූ අතර වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	(ඇ) 2018 ජනවාරි මාසයෙහි කරන ලද විදුලිය සඳහා ගෙවීම උපචිත වියදම් ගිණුම හර විය යුතු වුවත් වැරදීමකින් විදුලි වියදම් ගිණුමට හර කොට ඇත. නිවැරදි කිරීම සඳහා සටහන් තබා ගන්නා ලදි.
(ඈ) තාක්ෂණික ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෛද්‍ය මධ්‍යස්ථානයේ විවිධ තොග අයිතම මූල්‍ය ප්‍රකාශන තුල හෙලිදරවු කල යුතු වුවත් , එම ශේෂය සත්‍යාපනය කර ගිණුම්ගත කර නොතිබුණි.	(ඈ) 2019 වසරේ වාර්ෂික ගිණුම් වාර්තා සමඟ අදාල ගැලපීම් සිදු කර නිවැරදි කිරීම් සිදු කරනු ඇත.
(ඉ) පසුගිය වර්ෂයේ දී සිදුකල ගිණුම්කරණමය දෝෂ නිවැරදි නොකිරීම	
(i) 2018 වර්ෂය තුල ප්‍රතිස්ථාන සහ සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් ලැබුණ රු. 3,499,000 ක ප්‍රදානයක් අයහාර ආදායම් ලෙස ද, එකී ව්‍යාපෘතිය වෙනුවෙන් දැරූ රු. 186,667 ක වියදමක් අයහාර වියදමක් ලෙස ද සැලකීම හේතුවෙන් 2018 වර්ෂයේ මෙහෙයුම් කටයුතු මත ඌනතාවය රු. 3,312,333කින් අඩු වී තිබුණි.	(i) අදාල නිවැරදි කිරීම් 2019 වසරේ වාර්ෂික ගිණුම්වාර්තා සමඟ ඉදිරිපත් කිරීමට සටහන් තබා ගන්නා ලදි.
(ii) දියගම ප්‍රතිස්ථාපන සහ සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් 2017 වර්ෂය තුල දරන ලද රු. 11,767,051 ක පිරිවැය කෙරීගෙන යන වැඩ යටතේ දක්වා නොතිබුණු අතර ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස හඳුනාගෙන තිබීම හා මෙම වැය කිරීම වෙනුවෙන් 2017 වර්ෂයේ දී ලැබුණ රු. 5,000,000 ක ප්‍රදානයන් හා මෙහෙයුම් ආදායම් ලෙස ගිණුම්ගත කිරීමෙන් වූ දෝෂය සමාලෝචිත වර්ෂයේ දී ද නිවැරදි නොකිරීමෙන් එකතු ඌනතාවය රු. 5,360,051 කින් වැඩියෙන් දක්වා තිබීම හා කෙරීගෙන යන වැඩ ගිණුම රු. 11,767,051 කින් අඩුවෙන් දක්වා තිබුණි.	(ii) මෙම ගිණුම් වල අදාල නිවැරදි කිරීම් සිදු කිරීමට සටහන් තබා ගන්නා ලදි.

විගනන මතය		පැහැදිලි කිරීම් / ගෙන ඇති ක්‍රියාමාර්ග
2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාව අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධාන වලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.		
නීති,රීති/ විධානයට යොමුව	**විස්තරය**	
(අ) විශ්වවිද්‍යාල පනතේ අංක **45 (2)(1)(xv)** ප්‍රකාරව	විශ්වවිද්‍යාලයට අයත් කවර මුදලක් වුවත් නීත්‍යානුකූලව ආයෝජනය කළ හැකි නම් සුරකුම්පතක ආයෝජනය කිරිම හෝ කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද යම් බැංකුවක ස්ථාවර තැම්පත් මුදලක් ලෙස තැම්පත් කල යුතු වුව ද වටිනාකම් රු. **3,082,004** ක් වූ අරමුදල **6** ක් කිසිදු ආයෝජන කටයුත්තකට යොදා නොගෙන තාක්ෂණික ආයතනයේ ජංගම ගිණුමේ රඳවාගෙන තිබුණු බව නිරීක්ෂණය ඒ අනුව කටයුතු කර නොතිබුණි.	(අ) ඔබ විසින් පෙන්වා දී ඇති රු. **204,676.00** ක මුදල අරමුදල් ගිණුමක් නොවන අතර එය නාවුක අධ්‍යයන අංශයේ විවිධ වියදම් සඳහා වූ ප්‍රාග්ධන ගිණුමකි. ඉතිරි ඒවා සඳහා නිර්ණායක සැකසෙන තෙක් අරමුදල් ආයෝජනය කිරීමට කටයුතු යොදා ඇති නමුත් දැනට මෙම මුදල් පුනරාවර්තන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා පුනරාවර්තන වැය සඳහා වියදම් වී ඇත.
(ආ) මුදල් රෙගුලාසි **757 (ඇ) 2 (අ)**	**2018** වර්ෂය වෙනුවෙන් භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත් **2019** මැයි **10** දින වන තෙක් එම වාර්තා විගණනයට ඉදිරිපත් නොකෙරුණි.	(ආ) තාක්ෂණික ආයතනයේ **2018.12.31** දිනෙන් අවසන් වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ කටයුතු සඳහා සමීක්ෂණ මණ්ඩල **10** ක් නම් කර **2018.12.14** වන දින අදාල මණ්ඩල සභාපතිවරුන් වෙත ලබා දී ඇත. ඒ අනුව සමීක්ෂණ මණ්ඩල **05** ක වාර්තා ලැබී ඇති අතර ඉතිරි සමීක්ෂණ මණ්ඩල වාර්තා නැවත් සිහි කැඳවීම් සිදු කිරීමෙන් පසුව **2019.05.30** වෙනි දිනට පෙර ලබා දීමට එකඟ විය. දැනට ලැබී ඇති වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇති අතර ඉතිරි වාර්තා ලැබුණ වහා ම විගණන අංශය වෙත යොමු කිරීමට කටයුතු කරනු ඇත
(ඇ) මුදල් රෙගුලාසි **445**	සෑම ගිණුමක් සඳහා ම මුදල් පොත් පවත්වාගෙන යා යුතු වුවත් තාක්ෂණ ආයතනයේ අංක **83062337** දරණ රැස් කිරීමේ ගිණුම වෙනුවෙන් මුදල් පොතක් පවත්වාගෙන ගොස් නොතිබුණි.	(ඇ) මේ වන විට ගිණුම් අංක **83062337** සඳහා මුදල් පොතක් ආරම්භ කොට ඇත.

විගනන මතය	පැහැදිලි කිරීම් / ගෙන ඇති ක්‍රියාමාර්ග
2.4 2018 අංක **19** දරණ ජාතික විගණන පනතේ **12** (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුල අදාල නීති රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.	
(අ) **2018** වර්ෂයේ රු. **4,270,000**ක ප්‍රාග්ධන ලැබීම් අවසාන ගිණුම් තුල රු. **6,470,000** ක් ලෙස දක්වා තිබුණ අතර ඒ තුල වාර්ෂික අයවැය ප්‍රතිපාදනයන් නොවන උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ප්‍රතිස්ථාපන හා සංවර්ධන ව්‍යාපෘතිය හා සෞන්දර්යාත්මක කටයුතු වෙනුවෙන් ලබා දී තිබුණු රු. **2,220,000** ප්‍රතිපාදනයන් ද අන්තර්ගතව තිබුණි. එමෙන්ම **2018** වර්ෂයේ දී ලැබුන රු.**4,270,000**ක ප්‍රාග්ධන ප්‍රතිපාදන අතරින් රු.**2,250,000** ක ප්‍රතිපාදනයන් **2018** වර්ෂය අවසන් වන තෙක් ම අයභාර බැංකු ගිණුමේ රඳවාගෙන තිබුණි.	(අ) පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් වලට අදාල සියලු මුදල් පුනරාවර්ථන ගිණුමට බැර කරයි. ඉන් රු. **2,020,000.00** මුදලක් ප්‍රාග්ධන ගිණුමට මාරු කල අතර **2017/2018** වසර වලදී පුනරාවර්තන ගිණුමෙන් කල ප්‍රාග්ධන වියදම් වල වටිනාකම රු. **1,740,550.90**ක් වේ. ඉතිරි මුදල **2019** වසරේ ප්‍රාග්ධන ගිණුමට බැර කිරීමට සටහන් තබා ගන්නා ලදී.
(ආ) භාණ්ඩාගාරයෙන් වර්ෂ කීපයක සිට ලැබී තිබුණ ප්‍රාග්ධන ප්‍රදාන සමාලෝචිත වර්ෂය ආරම්භයේ දී රු. **11,525,214** ක් හා සමාලෝචිත වර්ෂය තුල රු. **6,470,000**ක් ලෙස එකතුව රු. **17,995,214** ක් විය. මෙම වර්ෂය තුල ඉන් උපයෝජනය කර තිබූ ප්‍රතිපාදනය රු. **3,197,057**ක් වූයෙන් උපයෝජනය නොවූ ප්‍රතිපාදනය රු. **14,798,158**ක් විය.	(ආ) මේ පිළිබඳ සොයා බලා අවශ්‍ය කටයුතු කිරීමට සටහන් තබා ගන්නා ලදී.
(ඇ) **2018** වර්ෂය තුල දී අරමුදල් ස්ථාපිත කිරීමේ දී ඇති කර ගත් අරමුණු වලට පටහැනිව තාක්ෂණ ආයතනයේ මෙහෙයුම් වියදම් පියවා ගැනීම සඳහා අරමුදල් **03** ක ස්ථිර තැම්පත් ලෙස ආයෝජනය කර තිබූ රු. **5,688,895** ක මුදලක් ආපසු ලබා ගෙන තිබුණි.	(ඇ) ඔබ විසින් පෙන්වා දී ඇති ස්ථිර තැන්පතු අරමුදල් ආපසු ලබා ගැනීමට සිදු වූයේ **2018** වර්ෂය සඳහා පුනරාවර්ථන වියදම් වෙනුවෙන් රජයේ ප්‍රතිපාදන ප්‍රමාණවත් තරම් නොලැබීම නිසා එහි සඳහන් කර ඇති එක් ආයෝජනයක් වන **Divisional Development Fund-Electrical** වන අරමුදල බැංකුව විසින් ස්ථාවර තැම්පත් ලෙස භාර නොගැනීම නිසා එය ආදායමට ගෙන ඇත.
(ඈ) **2018/12/31** දිනට වටිනාකම රු. **8,125,524**ක් වූ අරමුදල් **03**ක් එම අරමුදල් ස්ථාපිත කළ දින සිට වසර **12**ක් දක්වා කිසිදු කාර්යයක් සඳහා යොදා ගැනීමකින් තොරව අක්‍රීයව පැවති අතර වටිනාකම රු. **2,070,147**න් වූ අරමුදල් **04**ක් සඳහා මුදල් බැර කිරීම සිදු කර තිබුණ ද වසර **10**කට වැඩි කාලයක සිට එම අරමුදල් තුලින් අපේක්ෂිත අරමුණු සඳහා මුදල් වය කිරීමකින් තොරව ඌන උපයෝජිතව පැවතුණි.	(ඈ) දැනට මෙම අරමුදල් ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර ඇති අතර එම අරමුදල් වලින් ගෙවීම් කිරීමට ඉල්ලීමක් මෙතෙක් ඉදිරිපත් නොවීය.

විගනන මතය	පැහැදිලි කිරීම් / ගෙන ඇති ක්‍රියාමාර්ග
(ඉ) සිසුන් වෙනුවෙන් ශිෂ්‍යත්ව පිරිනැමීමේ අරමුණින් ස්ථාපිත කර තිබුණ ශිෂ්‍යත්ව අරමුදල් 18ක් අතුරින් එකතුව රු. 1,383,072 ක් වූ අරමුදල් 13කින් ම සමාලෝචිත වර්ශය තුල දී කිසිදු ශිෂ්‍යත්වයක් පිරිනමා නොතිබුණි.	(ඉ) මෙම ශිෂ්‍යත්වයන් බොහොමයක් පිරිනැමෙනුයේ සිසුන් වෙනුවෙන් පැවැත්වෙන ඩිප්ලෝමා ප්‍රධානෝත්සවයේ දී වන අතර 2018 වසර සඳහා ඩිප්ලෝමා ප්‍රධානය සඳහා අයදුම්පත් කැඳවනු ලැබුව ද සිසුන් විසින් එය වර්ජනය කිරීම නිසා මේ වන තෙක් එවැනි උත්සවයක් නොපවත්වන ලදි.
(ඊ) විදුලි බිල්පත් නියමිත දිනට නොගෙවීම හේතුවෙන් රු. 477,099 ක දඩ මුදලක් සමාලෝචිත වර්ශයේ දී ගෙවා තිබුණි.	(ඊ) 2018 වසරේ ආයතනය සඳහා පුනරාවර්තන වියදම් වෙනුවෙන් ලැබුණු අයවැය ප්‍රතිපාදනය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් මෙලෙස විදුලි වියදම සඳහා පොළී ප්‍රමාණයක් ගෙවීමට සිදු විය.
(උ) 2018 වර්ෂය සඳහා තාක්ෂණික ආයතනය විසින් ඉලක්ක 07ක් යටතේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර තිබුණ අතර එම ඉලක්ක ලඟා කර ගැනීමේ ප්‍රගතිය පිළිබඳ පරීක්ෂා කිරීමේ දී පහත කරුණු නිරීක්ෂණය විය.	
(i) පර්යේෂණ සිදු කිරිම තුලින් නවෝත්පාදන හා නිර්මාණශීලීත්වය ඉහල නැංවීමේ අරමුණින් සමාලෝචිත වර්ෂය තුල රු. 1,750,000ක අයවැය ප්‍රතිපාදන වෙන් කර පර්යේෂණ වාර්තා 57ක් ඉදිරිපත් කිරීමට සැලසුම් කර තිබුණ අතර 2018 වර්ෂය තුලදී පර්යේෂණ වාර්තා 31ක් පමණක් ඉදිරිපත් කර තිබුණ අතර ඒ සඳහා වැය කරන ලද මුදල රු. 215,872ක් විය.	(i) අන්තර්ජාතික වශයෙන් ඉදිරිපත් කරන ලද පර්යේෂණපත්‍රිකා 11ක් 2018 වසරේ තිබීම ගුණාත්මකව වර්ධනීය තත්වයකි. කෙසේ වෙතත් වාර්ෂික පර්යේෂණ සැසි වලදී ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ වාර්තා සංඛ්‍යාත්මකව වැඩි කිරීම කෙරෙහි ඉදිරියේ දී කටයුතු කරනු ඇත.
(ii) සමාලෝචිත වර්ෂය තුල රු. 3,000,000ක අයවැය ප්‍රතිපාදන වෙන් කර අධ්‍යයන, පරිපාලන සහ අනධ්‍යයන කාර්යය මණ්ඩලය වෙනුවෙන් සංවර්ධන වැඩසටහන් 3 බැගින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. එහෙත් 2018 වර්ෂය තුලදී රු. 114,000ක් වැය කර අධ්‍යයන, සහ අනධ්‍යයන කාර්යය මණ්ඩලය වෙනුවෙන් සංවර්ධන වැඩසටහන් 02 බැගින් ක්‍රියාත්මක කර තිබුණ ද පරිපාලන කාර්යය මණ්ඩලය වෙනුවෙන් කිසිදු වැඩසටහනක් ක්‍රියාත්මක කර නොතිබුණි.	(ii) පරිපාලන නිළධාරීන්ට අදාල සංවර්ධන වැඩසටහන් සඳහා ඔවුන් බාහිර ආයතන වෙත යොමු කළ යුතු වේ. නමුත් 2018 වසරේ දී ලබා දෙන ප්‍රතිපාදන ඉතා අවම වීම මත වැඩි දුර පුහුණු කිරීමේ වැඩසටහන් සඳහා යොමු කිරීමේ අවස්ථාවක් නොවීය. ඉදිරි වසරේ දී ඔවුන් සඳහා පුහුණු අවස්ථා වැඩියෙන් ලබා දීමට කටයුතු කිරීමට අපේක්ෂිතය.
(iii) ශිෂ්‍යයන්ගේ පෞරෂත්ව සංවර්ධනය සඳහා නව පද්ධතියක් හඳුන්වා දීමේ අරමුණින් 2018 වර්ෂය තුල දී ශිෂ්‍ය සංවර්ධන ඒකකයක් ස්ථාපිත කිරීම නායකත්ව සංවර්ධන වැඩටහන් ක්‍රියාත්මක කිරීම සහ වෘත්තීය මාර්ගෝපදේශන අංශයක් ස්ථාපිත කිරීම යන ක්‍රියාකාරකම් සැලසුම් කර තිබුණ ද 2018 දෙසැම්බර් 31 දින වන විට ද ස්ථාපිත කර නොතිබුණි.	(iii) ශිෂ්‍යයන්ගේ පෞරෂත්ව සංවර්ධනය සඳහා නව පද්ධතියක් හඳුන්වා දීමේ අරමුණින් ශිෂ්‍ය සංවර්ධන කමිටුවක් ආයතනය තුල ස්ථාපිත කර ඇති අතර ශිෂ්‍ය නායකත්ව සංවර්ධන වැඩසටහන් කීපයක් 2018 වසරේ දී ද ක්‍රියාත්මක කොට ඇත
(iv)තාක්ෂණ ආයතනය තුල ඵලදායී කළමණාකරණ තොරතුරු පද්ධතියක් (MIS) සංවර්ධනය කිරීම සඳහා 2016 වර්ෂයේ සිම සැලසුම් කර තිබුණ ද 2018/12/31 වන විට ද එම පද්ධතියේ මූලික සකස් කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පැවතිය ද පද්ධතියෙන් අවශ්‍ය කාර්යයන් ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණි.	(iv) ආයතනයේ අවශ්‍යතාවයට අනුව ශිෂ්‍ය තොරතුරු පවත්වාගෙන යාම සඳහා තොරතුරු පද්ධතිය සම්බන්ධ මූලික කටයුතු සිදු වෙමින් පවතින නමුත් 2018 වර්ෂය තුල දී එය ප්‍රායෝගිකව භාවිතයට ගත හැකි නොවීය. ඉදිරි වසරේ ශිෂ්‍ය ලියාපදිංචිය සඳහා දැනට සකස් කරමින් පවතින මෘදුකාංගය යොදා ගැනීමට අපේක්ෂිතය.

විගනන මතය	පැහැදිලි කිරීම් / ගෙන ඇති ක්‍රියාමාර්ග
වෙනත් නිරීක්ෂණ	වෙනත් නිරීක්ෂණ
(අ) 2018/12/31 දිනට තාක්ෂණ ආයතනයේ අනුමත කාර්යය මණ්ඩලය 258ක් වූ අතර තත්‍ය ස්ථිර කාර්ය මණ්ඩලය 188ක් සහ තාවකාලික පදනම මත බඳවාගත් කාර්ය මණ්ඩලය 16ක් විය . එම අනුමත සහ තත්‍ය කාර්ය මණ්ඩලය සැසඳීමේ දී මුළු පුරප්පාඩු සංඛ්‍යාව 54ක් වූ අතර එම පුරප්පාඩු අධ්‍යයන, අනධ්‍යයන සහායක සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලවල පිළිවෙලින් 03 ක් සහ 07 ක් සහ 44 ක් විය. (ආ) තිරසර සංවර්ධනය තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින් ම කටයුතු කළ යුතු අතර සමාලෝචිත වර්ෂයට අදාලව විශ්වවිද්‍යාලය විසින් තම විෂයය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් දැනුවත් වී තිබුණ ද ඒ පිළිබඳ වාර්ෂික අයවැයට ඇතුලත් කිරීම, සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කිරීම කාර්ය සාධන දර්ශක හා කාර්ය සාධනය මනින සංඩිස්ථාන හඳුනාගෙන නොතිබුණි.	(අ) 2018 වසරේ සියලු පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවුවද සුදුස්සන් සීමිත වීම මත බඳවා ගැනීම් සම්පූර්ණ කර ගත නොහැකි විය. කෙසේ වෙතත් අදාල පුරප්පාඩු සඳහා පැනනගින සේවා අවශ්‍යතාවය මත තාවකාලික පදනමින් අධ්‍යයන කාර්යය මණ්ඩලය බඳවා ගනු ලැබේ. (ආ) තිරසර සංවර්ධනය තිරසර අරමුණු ලඟා කර ගැනීම සඳහා අදාල කාර්යයන් සම්බන්ධව ක්‍රියාත්මක වීමට තිරසර සංවර්ධන කමිටුවක් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මහත්මියකගේ සභාපතීත්වයෙන් පත් කර ඇත.අදාල කමිටුව විසින් අරමුණු සහ ඉලක්කගත ක්ෂේත්‍ර කිහිපයක් හඳුනාගෙන ඇති අතර එකී අරමුණු වෙනුවෙන් දැනට ආයතනය විසින් කරගෙන යනු ලබන ක්‍රියාමාර්ගයන් පිළිබඳ අවධානය යොමු කර ඇත. හඳුනාගෙන ඇති එම අරමුණු ඉටු කර ගැනීම පහසු වීම සඳහා එකී අරමුණු ක්‍රියාකාරී සැළසුම්වලට ඇතුලත් කිරීමේ අවශ්‍යතාවය පැහැදිලි කරගෙන ඇත. පත් කරන ලද කමිටුව මඟින් සකස් කරන ලද පළමු කමිටු වාර්තාව ආයතනයේ කළමණාකරණ මණ්ඩලය වෙත 2019.02.21 දින ඉදිරිපත් කරන ලද අතර දැනට හඳුනාගෙන ඇති තිරසර අරමුණු ආයතනයේ ක්‍රියාකාරී සැලසුම සඳහා අන්තර්ගත විය යුතු බවට කළමණාකරණ මණ්ඩලය තීරණය කරන ලදි. ආයතනය සඳහා ක්‍රියාකාරී සැලසුම සකස් කිරීම (2020-2025) සම්බන්ධ කටයුතු ඉටු කිරීම සඳහා මේ වන විට කටයුතු ආරම්භ කර ඇති අතර අදාල ක්‍රියාකාරී සැලැස්ම සඳහා, තිරසර සංවර්ධන කමිටුවේ නිර්දේශ යොදා ගැනීමට කටයුතු කිරීමට නියමිතව ඇත. හඳුනාගත් අරමුණු හා අදාල සන්ධිස්ථාන හඳුනා ගැනීම හා ක්‍රියාත්මක වීම සම්බන්ධ ප්‍රගතිය මැනීම පිළිබඳ කරුණු ඉදිරි කමිටු වාර වලදී සැලකිල්ලට ලක් කරනු ඇත

නිසි බලධාරි
තාක්ෂණික ආයතනය
මොරටුව විශ්වවිද්‍යාලය